# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1880/26 - 2014 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාදා - 2014.09.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

උක්ත කරුණ සම්බන්ධ නිවේදනය පළ කරන ලද අංක 1877/52 හා 2014.08.29 දින දරන *අති විශෙෂ* ගැසට් පත්‍රය මෙම *අති විශෙෂ ගැසට් පත්‍රය* පළ කරනු ලබන දින සිට අවලංගු වේ.

ටී.එම්. එල්.සී. සේනාරත්න,  
ලේකම්,  
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2014 සැප්තැම්බර් මස 19 වැනි දින.

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002.05.08 දිනැති අංක 1235/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මඟින් පළ කරන ලදුව 2002.05.01 දින සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා එයට වරින් වර කරන ලද සංශෝධන ප්‍රකාරව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නො වන පරිදි පහත දැක්වෙන ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ටී.එම්. එල්.සී. සේනාරත්න,  
ලේකම්,  
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2014 අගෝස්තු මස 29 වැනි දින

01. ක්‍රියාත්මක වන දිනය:- මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2006.01.01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.
02. පත්කිරීම් බලධරයා පිළිබඳ විස්තර :-

    2.1 පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර :-

| | | | |
|---|---|---|---|
| 3.1 | සේවා ගණය : | ජ්‍යෙෂ්ඨ විධායක<br>විධායක | |
| 3.2 | ශ්‍රේණි : | ජ්‍යෙෂ්ඨ විධායක | - විශේෂ ශ්‍රේණිය |
| | | විධායක | - III ශ්‍රේණිය |
| | | | - II ශ්‍රේණිය |
| | | | - I ශ්‍රේණිය |

1A - G 20278— 10 (2014/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04. සේවයේ කාර්යභාරය :-
කෘෂිකර්ම පර්යේෂණ තුළින් නව තාක්ෂණය හා නව ප්‍රභේද ජනනය කිරීම හා එම දැනුම ගොවි ජනතාවට හා අදාළ පාර්ශවකරුවන්ට ලබා දීම සඳහා වන ව්‍යාප්ති හා සන්නිවේදන කටයුතු ප්‍රවර්ධනය කරවීම තුළින් දේශීය කෘෂිකර්මයේ තිරසාර සංවර්ධනයක් ස්ථාපිත කිරීම, නිර්දේශිත ප්‍රභේදවල උසස් තත්ත්වයේ මූලික බීජ හා රෝපණ ද්‍රව්‍ය හා කෘෂිකාර්මික සංවර්ධනයට අදාළ අනෙකුත් සේවාවන් සැපයීම හා සමගාමීව ආහාර සුරක්ෂිතතාව අත්කර ගැනීමට දායක වීම.

05. වැටුප් :-

5.1 වැටුප් කේත අංකය : ජ්‍යෙෂ්ඨ විධායක - SL - 03 - 2006
විධායක - SL - 01 - 2006

5.2 වැටුප් පරිමාන : ජ්‍යෙෂ්ඨ විධායක - SL - 03 - 2006
රු.42,390 - 1310x12 - 58,110/-

විධායක - SL - 01 - 2006
රු.22,935 - 645x10 - 790x8 - 1050x17 -53,555/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය (රු.)* |
|---|---|---|
| III ශ්‍රේණිය | 1 පියවර (SL- 01 - 2006) | රු.22,935/- |
| II ශ්‍රේණිය | 12 පියවර (SL- 01 - 2006) | රු.30,175/- |
| I ශ්‍රේණිය | 20 පියවර (SL- 01 -2006) | රු.36,755/- |
| විශේෂ ශ්‍රේණිය | 1 පියවර (SL- 03 -2006) | රු 42,390/- |

06. සේවා ගණයට අයත් තනතුරු:-

6.1 අනුමත තනතුරු හා අනුමත තනතුරු සංඛ්‍යාව (කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පරිදි වේ.)

| *තනතුරු අනුමත ශ්‍රේණිය* | *වැටුප් කේතය* | *තනතුරු සංඛ්‍යාව* |
|---|---|---|
| විශේෂ | SL-03-2006 | 05 |
| I | SL-01-2006 | 66 |
| II | SL-01-2006 | 99 |
| II/III | SL-01-2006 | 129 |
| III | SL-01-2006 | 544 |

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට අයත් තනතුරු පිළිබඳ තොරතුරු පළමුවන උපලේඛනයෙහි සඳහන් වේ. රාජ්‍ය සේවයේ අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි කලින් කලට මෙම තනතුරු සංඛ්‍යාව වෙනස් විය හැකි ය.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- 838

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම සඳහා III , II හා I ශ්‍රේණි ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

6.3 සේවයේ තනතුරුවල ස්වභාවය :- ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

07. බඳවා ගැනීමේ ක්‍රමය :-

පළමු හා දෙවන පරිශිෂ්ටවල සඳහන් විෂය නිර්දේශ අනුව වෙන වෙනම ප්‍රශ්න පත්‍ර ඇතුළත් සීමිත හා විවෘත විභාග දෙකක් පවත්වනු ලැබේ. තෝරා ගනු ලබන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාව, ඔවුන් ලිඛිත විභාගයේ දී ලබා ගන්නා ලද සම්පූර්ණ ලකුණුවල එකතුව මත තීරණය කරනු ලැබේ. සේවයට බඳවා ගැනීමේ දී යම් වර්ෂයක දී බඳවා ගත යුතු සංඛ්‍යාව වනුයේ එම වර්ෂයේ ජූනි 30 දිනට සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වේ.

7.1 පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් බඳවා ගන්නා අනුපාතය:

| *ධාරාව* | *විවෘත* | *සීමිත* |
|---|---|---|
| කෘෂි සංවර්ධන | 45% | 55% |
| කෘෂි පර්යේෂණ | 60% | 40% |
| කෘෂි ආර්ථික විද්‍යා | 60% | 40% |

සටහන: 1. ඉහත එක් එක් ධාරාවන්ට අයත් තනතුරු පහත පරිදි වේ.

කෘෂි සංවර්ධන ධාරාව: -

| | | |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ | - | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| සහකාර අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන) | - | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ<br>සහකාර පළාත් අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ<br>සහකාර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | - | පළාත් සභා |
| විෂයානුගත විශේෂඥ | - | සේවා සංස්කරණ පුහුණු ආයතනය, බෝඹුවල |
| කථිකාචාර්ය | - | බස්නාහිර පළාත |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | - | දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන, හොරණ, හෝමාගම, වල්පිට, අඹේපුස්ස |

කෘෂි පර්යේෂණ ධාරාව:-

| | | |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) | - | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

කෘෂි ආර්ථික විද්‍යා ධාරාව:-

| | | |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) | - | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| කෘෂි ආර්ථික විද්‍යාඥ | - | බස්නාහිර පළාත් සභාව |

2. එක් එක් ධාරාවන් යටතේ වන තනතුරු සංඛ්‍යාවන් පහත පරිදි වේ. එක් එක් ධාරාව යටතේ වන තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගනු ලැබේ.

| | | |
|---|---|---|
| කෘෂි සංවර්ධන | - | 370 |
| කෘෂි පර්යේෂණ | - | 286 |
| කෘෂි ආර්ථික විද්‍යා | - | 17 |

3. සීමිත තරග විභාගය තුළින් පත් කිරීම් සඳහා වෙන් කර ඇති ප්‍රතිශතයට සරිලන සංඛ්‍යාවක් එසේ පත් කර ගැනීමට නො හැකි අවස්ථාවල දී ඉතිරි වන පුරප්පාඩු සංඛ්‍යාව ද විවෘත තරග විභාගය තුළින් පුරවනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම් ඃ

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය ඃ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණිය

සටහන ඃ එක් අයදුම්කරුවෙකුට කෘෂි සංවර්ධන , කෘෂි පර්යේෂණ හා කෘෂි ආර්ථික විද්‍යා යන ධාරාවන්ගෙන් එකකට හෝ කිහිපයකට හෝ ඉල්ලුම් කළ හැක.

7.2.2. සුදුසුකම්ඃ

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්ඃ-

7.2.2.1.1 කෘෂි සංවර්ධන ධාරාව සහ කෘෂි ආර්ථික විද්‍යා ධාරාව සඳහා

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා තිබීම.

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යාවේදී කෘෂිකාර්මික තාක්ෂණ කළමනාකරණය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා තිබීම.

7.2.2.1.2 කෘෂි පර්යේෂණ ධාරාව සඳහාඃ-

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා තිබීම

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විද්‍යා උපාධියක් ලබා තිබීම

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යාවේදී කෘෂිකාර්මික තාක්ෂණ කළමනාකරණය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම්ඃ අදාළ නො වේ.

7.2.2.3 පළපුරුද්දඃ අදාළ නො වේ.

7.2.2.4 කායික සුදුසුකම්ඃ සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා සෑම අයුරකින් ම ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

7.2.2.5. වෙනත් ඃ-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. එක් අයදුම්කරුවකුට උපරිම වශයෙන් අවස්ථා තුනක් පමණක් විවෘත තරග විභාගයට පෙනී සිටිය හැකි ය.
iv. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

7.2.3 වයසඃ-

7.2.3.1 අවම වයස් සීමාවඃ- අවුරුදු 22

7.2.3.2 උපරිම වයස් සීමාවඃ- අවුරුදු 30

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමයඃ-

7.2.4.1 ලිඛිත විභාගයඃ-

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය | 100 | 40 |
| විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය<br>(අදාළ තනතුරට අනුව-<br>විෂය නිර්දේශය පළමු පරිශිෂ්ටයේ දැක් වේ.) | 100 | 40 |

7.2.4.1.1 පවත්වන බලධරයාඃ විභාග කොමසාරිස් ජනරාල්

7.2.4.2 වෘත්තිය පරීක්ෂණය : අදාළ නො වේ.

7.2.4.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නො වේ.

7.2.4.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා දෙනු නො ලැබේ.

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේ දැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම.

සටහන : පළමු පරිශිෂ්ටයේ සඳහන් විෂයානුබද්ධ දැනුම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රවලට ලබා ගන්නා ලකුණු සංඛ්‍යාවේ එකතුවෙහි උපරිමයේ සිට අනුපිළිවෙල පදනම් කර ගනිමින් එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයින් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නො වැඩි සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසුව සුදුසුකම් සනාථ කරන අයදුම්කරුවන් අතුරින් විෂයානුබද්ධ දැනුම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර සඳහා ලබාගත් ලකුණුවල එකතුවෙහි උපරිම අනුපිළිවෙල මත පුරප්පාඩුවලට බඳවා ගනු ලැබේ.

7.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.4.2 විවෘත බඳවා ගැනීමේ දී උපලේඛනගත තනතුරු එකකට හෝ කිහිපයකට ඉල්ලුම් කොට, එකී තනතුරු කිහිපයක් සඳහා තෝරා ගනු ලැබීමට ප්‍රමාණවත් ලකුණු සංඛ්‍යාවක් ලබා ගෙන ඇති විටෙක අපේක්ෂකයාගේ මනාපය හා පුරප්පාඩු සංඛ්‍යාව ද සැලකිල්ලට ගෙන අවස්ථාවෝචිතව බඳවා ගැනීම සිදු කරනු ඇත. සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයාගේ මනාපය ලිඛිතව පළ කළ යුතු අතර, එය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමයඃ- රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම මඟින්

7.3 සීමිත බඳවා ගැනීමඃ-

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණියඃ- ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්

7.3.2.1 සීමිත බඳවා ගැනීම සඳහා වන මූලික සුදුසුකම්

7.3.2.1.1 කෘෂි සංවර්ධන ධාරාව සඳහා

(අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ කෘෂිකර්ම උපදේශක තනතුරක් දරන නිලධාරියෙකු වීම

හෝ

(ආ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ I පන්තියේ අවම වශයෙන් වසර 4 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබෙන කෘෂිකර්ම උපදේශක තනතුරක් දරන නිලධාරියෙකු වීම

හෝ

(ඇ) ඉහත 7.2.2.1.1හි සුදුසුකම් සපුරා ඇති ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ තනතුරක සේවය කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ එනම් කෘෂි පර්යේෂණ, කෘෂි සංවර්ධන හෝ කෘෂි ආර්ථික විද්‍යා යන ක්ෂේත්‍රයක වසර පහක (05ක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම

හෝ

(ඈ) වසර දහයක (10ක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති උද්‍යාන සහකාර තනතුරක් දරන නිලධාරියෙකු වීම

හෝ

(ඉ) වසර පහක (05ක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කෘෂිකර්ම විද්‍යා හෝ විද්‍යා උපාධියක් සහිත කෘෂිකර්ම උපදේශක හෝ උද්‍යාන සහකාර තනතුරක් දරන නිලධාරියෙකු වීම.

7.3.2.1.2 කෘෂි ආර්ථික විද්‍යා ධාරාව සඳහා

(අ) වසර පහක (05ක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආර්ථික විද්‍යාඥ සහකාර තනතුරක් දරන නිලධාරියෙකු වීම

හෝ

(ආ) ඉහත 7.2.2.1.1හි සුදුසුකම් සපුරා ඇති ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ තනතුරක සේවය කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ එනම් කෘෂි පර්යේෂණ, කෘෂි සංවර්ධන හෝ කෘෂි ආර්ථික විද්‍යා යන ක්ෂේත්‍රයක වසර පහක (05ක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම

7.3.2.1.3 කෘෂි පර්යේෂණ ධාරාව සඳහා

(අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ පර්යේෂණ සහකාර, පස් සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරි තනතුරක් දරන නිලධාරියෙකු වීම

හෝ

(ආ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ I පන්තියේ අවම වශයෙන් වසර 4ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබෙන පර්යේෂණ සහකාර, පස් සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරි තනතුරක් දරන නිලධාරියෙකු වීම

හෝ

(ඇ) ඉහත 7.2.2.1.2හි සුදුසුකම් සපුරා ඇති ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ තනතුරක සේවය කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ එනම් කෘෂි පර්යේෂණ, කෘෂි සංවර්ධන හෝ කෘෂි ආර්ථික විද්‍යා යන ක්ෂේත්‍රයක වසර පහක (05ක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම

හෝ

(ඇ) වසර පහක (05ක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කෘෂිකර්ම විද්‍යා හෝ විද්‍යා උපාධියක් සහිත පර්යේෂණ සහකාර, පස් සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරි තනතුරක් දරන නිලධාරියෙකු වීම

සටහන: 1. ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ තනතුරු දරන නිලධාරීන් කෘෂි සංවර්ධන හෝ කෘෂි ආර්ථික විද්‍යා හෝ කෘෂි පර්යේෂණ යන ධාරාවන් අතුරින් එක් ධාරාවක් යටතේ පමණක් අයදුම් කළ යුතු ය.

2. ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් අංක: 61/2006හි තීරණයට අනුව, අංක: 1619/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.09.18 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ ද සඳහන් පරිදි 2009.11.04 දින වන විට කෘෂි මෙහෙයුම් නිලධාරී හෝ වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) යන තනතුරක් දරන ලදුව, වසර 05 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ කෘෂි මෙහෙයුම් නිලධාරී හෝ වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) යන තනතුරක් දරන නිලධාරීන් ද සීමිත බඳවා ගැනීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

මෙම නිලධාරීන්ට සීමිත බඳවා ගැනීම සඳහා අයදුම් කළ හැකි වන්නේ කෘෂි සංවර්ධන හෝ කෘෂි ආර්ථික විද්‍යා හෝ කෘෂි පර්යේෂණ යන ධාරාවන් අතුරින් එක් ධාරාවක් යටතේ පමණි

7.3.2.2. කායික සුදුසුකම්:- සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා සෑම අයුරකින් ම ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

7.3.2.3. වෙනත්:-

i. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

ii. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට හෝ ඊට පෙර අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

iii. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට පසුව අයදුම්කරුවෙකුට අතීතයට බල පැවැත්වෙන පරිදි ලබා දෙනු ලබන සහන හෝ උසස්වීම් විභාගයට පෙනී සිටීම සඳහා නියමිත සුදුසුකම් සපුරාලීමක් සේ සලකා බලනු නො ලැබේ.

iv. පූර්වාසන්නතම වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.3.3 බඳවා ගැනීමේ ක්‍රමය:-

7.3.3.1 ලිඛිත විභාගය:- සීමිත විභාගයේ දී විෂයානුබද්ධ දැනුම මැන බැලීමේ ප්‍රශ්න පත්‍රය ක්ෂේත්‍ර පළපුරුද්දට වැඩි නැඹුරුවක් වන සේ සකස් කරනු ලැබේ. (දෙවන පරිශිෂ්ටය බලන්න)

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය (අවම)* |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය | 100 | 40 |
| විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය<br>(අදාළ තනතුරට අනුව<br>විෂය නිර්දේශය දෙවන පරිශිෂ්ටයේ දැක් වේ.) | 100 | 40 |

7.3.3.1.1 පවත්වන බලධරයා- විභාග කොමසාරිස් ජනරාල්

7.3.3.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නො වේ.

7.3.3.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ජ්‍යෙෂ්ඨතාවට ලකුණු ලබා දීම හා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සිදු කෙරේ.

අ) අයදුම්කරුවන් බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රයට සහ ඉහත 7.1 ඡේදයේ සඳහන් එක් එක් බඳවා ගැනීමේ තනතුර සඳහා දෙවන පරිශිෂ්ටයේ නියම කර ඇති අදාළ විෂයානුබද්ධ දැනුම ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතු ය.

ආ) නියමිත ප්‍රශ්න පත්‍ර දෙක සඳහා ම 40% හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ඇ) එම සම්මුඛ පරීක්ෂණයේ දී ම අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ ලියකියවිලි හා සහතිකපත් ද පරීක්ෂා කරනු ලැබේ.

ඇ) සීමිත තරග විභාගයේ දී නියමිත ප්‍රශ්න පත්‍ර වලට ලබා ගන්නා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවේ සහ ජ්‍යෙෂ්ඨතාව වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන ලකුණු සංඛ්‍යාවේ එකතුවෙහි උපරිම අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේ දී ජ්‍යෙෂ්ඨතාව සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමය:- අයදුම්කරුවෙකු නියමිත සුදුසුකම් සපුරන ලද දින සිට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දින දක්වා සේවය කළ සක්‍රීය කාල සීමාව පමණක් ජ්‍යෙෂ්ඨතාවට ලකුණු දීම සඳහා ගණන් ගනු ලැබේ. ලකුණු 30ක උපරිමයකට යටත්ව එම සක්‍රීය සේවා කාලයට ගැනෙන එක් වසරකට ලකුණු 02 ක් බැගින් ද, දින 180ක් හෝ ඊට වැඩි සේවා කාලයක් වෙනුවෙන් ලකුණු 01 බැගින් ද ප්‍රදානය කරනු ලැබේ.

7.3.3.3.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.3.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - අදාළ නො වේ.

7.3.4. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය- රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම මඟින් සහ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මඟින් සහ වෙබ් අඩවියේ පළ කිරීම මඟින්

8. කාර්යක්ෂමතා කඩඉම

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය (ලිඛිත/වෘත්තීය සහතික පාඨමාලා/වෙනත්)* |
|---|---|---|
| 1වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට පත් වී වසර තුනක් ගත වීමට පෙර | ලිඛිත (3වන පරිශිෂ්ටය බලන්න) |
| 2වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුනක් ගත වීමට පෙර | ලිඛිත (4වන පරිශිෂ්ටය බලන්න) |
| 3වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහක් ගත වීමට පෙර | ලිඛිත පර්යේෂණ නිබන්ධනයක් (5වන පරිශිෂ්ටය බලන්න) |

8.1 කාර්යක්ෂමතා කඩඉම අදාළ වසර ගණන ගත වීමට පෙර සමත් විය යුතු ය.

8.2. පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද- වර්ෂයකට දෙ වතාවක් පවත්වනු ලැබේ.

8.3. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද-

අ) පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

I හා II ප්‍රශ්න පත්‍ර (මූල්‍ය ක්‍රම හා පරිපාලනය ප්‍රශ්න පත්‍ර)-
විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරනු ලබන ආයතනයක් විසින්

III ප්‍රශ්න පත්‍රය (ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවිධානය)-
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

ආ) දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ පරීක්ෂණය)-
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

ඇ) තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය- 5වන පරිශිෂ්ටයේ සඳහන් කමිටුව මඟින්

9. භාෂා ප්‍රවීණතාවः-

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නො වන භාෂාවකින් සේවයට පත් වූ නිලධාරියෙකු සේවයේ ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාව ලබා ගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකः 07/2007 හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතු ය. |

10. ශ්‍රේණි උසස් කිරීමः-

කාර්ය සාධනය පදනම් කර ගත් පහත සඳහන් උසස් කිරීමේ ක්‍රමයකින් සමන්විත වේ.

10.1 (III)වන ශ්‍රේණියේ සිට (II)වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු අවශ්‍යතා

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයා ගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වසර දහය (10)ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්නයෙන් වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය- සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරින් විසින් නියමිත ආකෘති පත්‍රය මඟින් පත් කිරීමේ බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. අදාළ අයදුම්පත්‍රය 6වන පරිශිෂ්ටයෙහි ඇත.

10.2. IIවන ශ්‍රේණියේ සිට Iවන ශ්‍රේණියට උසස් කිරීම:-

10.2.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හත (07)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හත (07)ක් උපයා ගෙන තිබීම.

ii. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

iii. උසස් වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීම සඳහා පූර්වාසන්න වසර හත (7)ක කාලසීමාවක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධන මට්ටමක් ළඟා කර ගෙන තිබීම.

v. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පශ්චාත් උපාධි සුදුසුකම් තීරණය කරනු ලබන කමිටුව (5වන පරිශිෂ්ටය බලන්න) විසින් පිළිගනු ලබන එක් අවුරුදු විද්‍යාපති (MSc) හෝ ඒ හා සමාන සුදුසුකමක් හෝ ඊට ඉහළ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

10.2.2. උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් විසින් පත් කිරීමේ බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. උසස් වීම සඳහා අදාළ වන අයදුම්පත්‍රය 6 පරිශිෂ්ටයෙහි ඇත.

10.3. I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

10.3.1. සපුරාලිය යුතු සුදුසුකම්:-

i. අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

ii. උසස් වීම සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05)ක් උපයා ගෙන තිබීම.

iii. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට, සුදුසුකම් ලබන ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ වසර දහඅටකට (18) නො අඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

v. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නො වී තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.3.2 උසස් කිරීමේ ක්‍රමයඃ-

විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයකට නො වැඩි සංඛ්‍යාවක් I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ඉහත සුදුසුකම් සියල්ල සපුරා තිබේ දැයි පරීක්ෂා කර බලා, එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිපාටියකට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලැබේ. ලකුණුවල අනුපිළිවෙල පදනම් කරගෙන පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ.

සටහන- සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් සමත් නො වන නිලධාරීන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතු ය.

11 තනතුරුවලට පත් කිරීම

11.1

| තනතුරු නාමය | ආයතනය | සුදුසුකම් |
|---|---|---|
| අතිරේක ලේකම් | කෘෂිකර්ම අමාත්‍යාංශය | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම. |
| කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම අමාත්‍යාංශය | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු වීම. |
| කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම අමාත්‍යාංශය | |
| පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| අතිරේක අධ්‍යක්ෂ | වාරිමාර්ග අමාත්‍යාංශය | |
| පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යක්ෂ | පළාත් සභා | |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ IIවන ශ්‍රේණියේ නිලධාරියෙකු වීම. |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | සේවා සංස්කරණ පුහුණු ආයතනය- බෝඹුවල | |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ/ පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | පළාත් සභා | |

11.2 තෝරා ගනු ලබන ක්‍රමය-

කෘෂිකර්ම අධ්‍යක්ෂ, අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරු සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ වසර තුන (03)ක පළපුරුද්ද සහිත නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පටිපාටියකට අනුව තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පටිපාටියකට අනුව තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරු සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II ශ්‍රේණියේ වසර තුන (03)ක පළපුරුද්ද සහිත නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පටිපාටියකට අනුව තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

| තනතුරු නාමය | ආයතනය | පත්කිරීමේ ක්‍රමය |
|---|---|---|
| කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබේ. |
| අතිරේක ලේකම් | කෘෂිකර්ම අමාත්‍යාංශය | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම අමාත්‍යාංශය | |
| කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම අමාත්‍යාංශය | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. |
| පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| අතිරේක අධ්‍යක්ෂ | වාරිමාර්ග අමාත්‍යාංශය | |
| පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යක්ෂ | පළාත් සභා | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | සේවා සංස්කරණ පුහුණු ආයතනය- බෝඹුවල | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ/ පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | පළාත් සභා | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. |

12. සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංකඃ 1589/ 30 හා 2009. 02. 20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන විධිවිධාන හා ආයතන සංග්‍රහයේ විධිවිධාන හා පොදු කොන්දේසි ද අදාළ වේ.

පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසිඃ

i. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරීන් අවශ්‍යතාව අනුව පළාත් රාජ්‍ය සේවයේ ද සේවය කිරීමට යටත් ය. මේ සඳහා පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය කිරීමට තාවකාලිකව මුදා හරිනු ඇත. එසේ සේවය කළ යුතු කාලය තීරණය කරනු ලබන්නේ සේවා අවශ්‍යතාව, කාර්ය මණ්ඩලය යෙදවීමේ අවශ්‍යතාව සහ වෙනත් අදාළ කරුණු ද අනුව අදාළ පළාත් බලධරයා සහ පත්කිරීමේ බලධරයා අතර ඇති කර ගනු ලබන එකඟතාව මත ය.

(අ) සේවයෙන් මුදා හැරීමේ කොන්දේසිවලට යටත්ව පත්වීම් ලිපියක් පළාත් බලධරයා විසින් අදාළ නිලධාරියා වෙත නිකුත් කරනු ඇත. අදාළ පළාත් බලධරයා විසින් පළාත තුළ ස්ථානමාරු කිරීම් කරනු ලැබීමට යටත් වනු ඇත.

(ආ) පළාත් රාජ්‍ය සේවය සඳහා මුදා හරිනු ලැබුව ද එම කාලය තුළ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාලනයට සහ විනය පාලනයට යටත් වනු ඇත.

(ඇ) පළාත් රාජ්‍ය සේවය සඳහා මුදා හරින ලද කාලය අවසානයේ දී නිත්‍ය සේවයට ආපසු පැමිණිය යුතු ය.

ii. III ශ්‍රේණියට පත්කිරීමේ දී විවෘත තරග විභාගයෙන් බඳවා ගනු ලබන නිලධාරීන් අවුරුදු 03ක පරිවාස කාලයකට ද, සීමිත තරග විභාග ප්‍රතිඵල මත පත්කරන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට ද යටත්ව පත් කරනු ලැබේ. විවෘත බඳවාගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්විය යුතු අතර සීමිත තරග විභාගයෙන් බඳවාගනු ලබන නිලධාරීන් වසර 3ක කාලයක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු වේ.

iii. නිපුණතා සංවර්ධනයඃ- සේවයට බඳවා ගත් නිලධාරීන් සඳහා කෘෂිකාර්මික සංවර්ධනයට අදාළ සමාජ, ආර්ථික, සංස්කෘතික හා රාජකාරි කරන පරිසරයේ ඇති ප්‍රවණතාවන් පිළිබඳ නිපුණතාවක් ලබා ගැනීමට අවශ්‍ය පුහුණුවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හෝ දෙපාර්තමේන්තුව හඳුනා ගන්නා වෙනත් ආයතනයක් විසින් (උදාඃ- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) මාසයක (මාස 01ක) පුහුණු පාඨමාලාවක් තුළින් ලබා දෙනු ඇත. පාඨමාලාව අවසානයේ කරනු ලබන ඇගයීමකින් පසු සහතිකයක් නිකුත් කරනු ලැබේ. සේවයේ ස්ථිර කිරීමට මෙම පුහුණු සහතිකය ලබාගත යුතු ය.

13. නිර්වචන

13.1 “ව්‍යවස්ථාව” යනුවෙන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය අදහස් කෙරේ.

13.2 “කොමිෂන් සභාව” යනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ix පරිච්ඡේදයේ 54 (i) වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ස්ථාපනය කරනු ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභාව අදහස් කෙරේ.

13.3 “සේවය” යනුවෙන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය අදහස් කෙරේ.

13.4 “අමාත්‍යාංශය” යනුවෙන් කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යාංශය අදහස් කෙරේ.

13.5 “ලේකම් ” යනුවෙන් කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් අදහස් කෙරේ.

13.6 “අධ්‍යක්ෂ ජනරාල් ” යනුවෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් අදහස් කෙරේ.

13.7 “දෙපාර්තමේන්තුව” යනුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අදහස් කෙරේ.

13.8 “සක්‍රීය සේවා කාලය” යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන් ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නො ලබන්නේ ය.

14. අන්තර්ග්‍රහණය

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක ඃ 06/2006 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති SL - 01 - 2006 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියලු දෙනාම ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කර ගෙන ය. කෙසේ වුව ද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නො විය යුතු අතර, එම දිනය අනතර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නො වෙනස්ව ක්‍රියාත්මක විය යුතු ය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන්වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නො කළ යුතු ය.

(i) සේවයේ IIIවන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමඃ-

(අ) සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ IIවන පන්තියේ IIවන ශ්‍රේණියේ සිටින නිලධාරීන් සේවයේ IIIවන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) සේවයේ IIවන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමඃ-

(අ) සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ IIවන පන්තියේ Iවන ශ්‍රේණියේ සිටින නිලධාරීන් සේවයේ IIවන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(iii) සේවයේ Iවන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමඃ-

(අ) සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට Iවන පන්තියේ සිටින නිලධාරීන්,

(ආ) සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට අධි සේවක පදනම මත සේවයේ I පන්තියට උසස් වීම් ලැබ සිටින නිලධාරීන්,

සේවයේ Iවන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(iv) සේවයේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම:-

(i) සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට විශේෂ ශ්‍රේණියට අයත් තනතුරුවලට ස්ථිරව පත් කර ඇති, විධායක සේවා ගණයේ වසර 18ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහ සේවා ව්‍යවස්ථාවේ 10.3.1 වගන්තියෙහි සඳහන් පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇති නිලධාරීන් විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. අන්තර් කාලීන විධිවිධාන

අන්තර් කාලය 2014.12.31 දක්වා බල පැවැත් වේ.

15.1 මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පසුව අන්තර් කාලය තුළ දී සේවයේ IIවන පන්තියේ IIවන ශ්‍රේණියට බඳවා ගත් නිලධාරීන් ඔවුන්ගේ පත්වීමේ දින සිට IIIවන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15.2 සේවයේ නියුතු නිලධාරීන් ප්‍රතිසංවිධිත සේවයේ නව තනතුරුවලට අන්තර්ග්‍රහණය කිරීම.

අ) සේවයේ යෙදී සිටින සියලුම පර්යේෂණ නිලධාරීන් කෘෂි පර්යේෂණ ධාරාවට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ආ) කෘෂිකර්ම නිලධාරීන්, කථිකාචාර්යවරුන් සහ විෂයානුගත විශේෂඥවරුන් කෘෂි සංවර්ධන ධාරාවට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ඇ) කෘෂි ආර්ථික විද්‍යාඥවරුන් කෘෂි ආර්ථික විද්‍යා ධාරාවට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සටහන- තනතුරු නාම හා අනුමත තනතුරු සංඛ්‍යාව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය පරිදි විය යුතු ය.

15.3 අන්තර්ග්‍රහණය හේතු කොටගෙන ක්‍රියාත්මක වන දිනයේ දී අදාළ පන්තිවල/ ශ්‍රේණිවල නිලධාරීන්ට හිමිව පැවති ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවට හානියක් සිදු නො වනු ඇත.

15.4 අන්තර් කාලය තුළ උසස් කිරීම් සිදු කිරීම:-

අන්තර් කාලය තුළ උසස්වීම් පහත සඳහන් පරිදි සිදු කළ යුතු ය. මෙම උසස්වීම් ක්‍රියාත්මක වන දිනය වනුයේ මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය හෝ අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දෙකෙන් පසුව එළඹෙන දිනය වේ.

15.4.1. II ශ්‍රේණියට උසස් කිරීම

(අ) 2002.05.08 දිනැති අංක: 1235/21 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය හා ඊට අදාළ සංශෝධන මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි II පන්තියේ II ශ්‍රේණියේ සිට II පන්තියේ I ශ්‍රේණියට පත් කිරීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම මත සේවයේ II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

ඉහත සේවයේ II ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධයෙන් වූ නිර්දේශ, ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලබා දෙනු ඇත.

15.4.2. (I) වැනි ශ්‍රේණියට උසස් කිරීම

(අ) මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ IIවන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරියෙකු හෝ අන්තර් කාලය තුළ IIවැනි ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරියෙකු,

(I) ඔහු/ ඇයගේ උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න අවුරුදු 05ක කාලයක් තුළ නියමිත දිනයන්හි දී වැටුප් වර්ධක සියල්ල උපයා ගෙන ඇත්නම්,

සහ

(II) උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න අවුරුදු පහ (05)ක කාලසීමාවක් තුළ වරදක් සඳහා විනයානුකූල දඬුවමකට භාජනය නො වී ඇත්නම්,

උසස් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

(ආ) පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසුව I ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ නිර්දේශ ඉදිරිපත් කරනු ඇත.

15.4.3. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයකට නො වැඩි සංඛ්‍යාවක් I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ඉහත 10.3.1 හි දක්වා ඇති සුදුසුකම් සියල්ල සපුරා තිබේ දැ’ යි පරීක්ෂා කර බලා, එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පටිපාටියකට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලැබේ. ලකුණුවල අනුපිළිවෙල පදනම් කරගෙන පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ.

16. සේවයට බඳවා ගැනීම හා ශ්‍රේණිගත උසස් වීම් සිදු කිරීම:

සේවයට බඳවා ගැනීම හා ශ්‍රේණිගත උසස් වීම් සිදු කිරීම් මෙම ව්‍යවස්ථාවේ දක්වා ඇති ක්‍රමවේද යටතේ පමණක් සිදු කළ යුතු ය.

17. මෙම ව්‍යවස්ථාවෙහි සඳහන් අවශ්‍යතාවන්ට අමතරව රජය විසින් කළින් කළ තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා සහ නිපුණතාවන් ද සියලු නිලධාරීන් විසින් නියමිත පරිදි ලබා ගත යුතු ය.

18. විශ්‍රාම ගැන්වීමේ විකල්පය:

නියමිත දිනය වන විට සේවයේ නියුතුව සිටින වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයසට එළඹ නැති නිලධාරියෙකු හට ඔහු විසින් කරනු ලබන ඉල්ලීමක් මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 7වැනි වගන්තිය යටතේ සේවයෙන් විශ්‍රාම ගැනීමේ මනාපය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දිය යුතු ය. එවන් සහනයක් පිරිනැමිය යුතු තරමට මෙම ව්‍යවස්ථාවේ විධිවිධානවලින් අහිතකර බලපෑමක් එම නිලධාරියාට ඇති වී ඇතැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම්, නියමිත දිනයේ සිට අවුරුදු පහ (05 )ක් තුළ ඔහුට/ ඇයට එම මනාපය ප්‍රකාශ කළ හැකි ය.

19. විධිවිධාන සලසා නොමැති කරුණු-

මෙම ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**පළමු උපලේඛනය**

අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | ආයතනය | තනතුරු සංඛ්‍යාව | ශ්‍රේණිය |
|---|---|---|---|
| අතිරේක ලේකම් | කෘෂිකර්ම අමාත්‍යාංශය | 02 | විශේෂ |
| කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 01 | |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 01 | |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 01 | |

**පළමු උපලේඛනය (සම්බන්ධිතයි)**

| *අනුමත තනතුරු නාම* | *ආයතනය* | *තනතුරු සංඛ්‍යාව* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| අධ්‍යක්ෂ | කෘෂිකර්ම අමාත්‍යාංශය | 02 | I |
| දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම අමාත්‍යාංශය | 25 | |
| පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 01 | |
| කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 10 | |
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 18 | |
| අතිරේක අධ්‍යක්ෂ | වාරි මාර්ග අමාත්‍යාංශය | 01 | |
| පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යක්ෂ | පළාත් සභා | 09 | |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 64 | II |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | සේවා සංස්කරණ පුහුණු ආයතනය- බෝඹුවල | 01 | |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ/ පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | පළාත් සභා | 34 | |
| සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>සහකාර/ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, සහකාර/ නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ, සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර/ නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම අමාත්‍යාංශය<br>පළාත් සභා | 02<br>118 | II/III |
| කෘෂි ආර්ථික විද්‍යාඥ | බස්නාහිර පළාත | 01 | |
| කථිකාචාර්ය | බස්නාහිර පළාත | 01 | |
| විෂයානුගත විශේෂඥ | සේවා සංස්කරණ පුහුණු ආයතනය- බෝඹුවල | 03 | |
| සහකාර/ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන - හොරණ, හෝමාගම, වල්පිට, අඹේපුස්ස | 04 | |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 242 | III |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 286 | |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 16 | |

***පළමු පරිශිෂ්ටය***

*විවෘත තරග විභාග රෙගුලාසි හා විෂයය නිර්දේශය*

**1වන ප්‍රශ්න පත්‍රය - බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය**

භාෂාමය, ගණිතමය හා තර්කන හැකියාව මැන බැලීම සඳහා බහුවරණ ප්‍රශ්න ඇතුළත් කෙටි ප්‍රශ්න පත්‍රයකි. කාලය පැය 1 1 /4 කි. මුළු ලකුණු සංඛ්‍යාව 100කි.

**2වන පත්‍රය - විෂයානුබද්ධ දැනුම මැන බැලීම**

මෙය නියම කර ඇති විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම මැන බැලීම සඳහා පවත්වනු ලබන තනතුරට ලිඛිත අභියෝගතා පරීක්ෂණයකි. එක් එක් අයදුම්කරුවෙකු විසින් තමන් ඉල්ලුම් කරනු ලබන තනතුරට හෝ තනතුරුවලට අදාළ වන පරිදි පහත සඳහන් ප්‍රශ්න පත්‍ර අතුරින් තෝරා ගනු ලබන ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටීමට අවකාශ ඇත. මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න හා බහුවරණ ප්‍රශ්න වලින් යුක්ත වේ. කාලය පැය 2ක් වන අතර මුළු ලකුණු සංඛ්‍යාව 100 ක් වේ.

සටහන:- පහත සඳහන් විෂය නිර්දේශය අනුව විවෘත විභාගයේ දී විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය න්‍යායාත්මක දැනුමට වැඩි නැඹුරුවක් වන සේ සකස් කරනු ලැබේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරන ආකාරයට විභාගය පවත්වනු ලැබේ.

එක් එක් තනතුරට අදාළ විෂයය නිර්දේශයන් පහත දැක්වේ.

1. කෘෂි පර්යේෂණ ධාරාව සඳහා ප්‍රශ්න පත්‍රයඃ
අයදුම්කරුවන්ගේ මනාපය පරිදි පහත (අ) සහ (ආ)හි සඳහන් කොටස් 02 අතරින් එක් කොටසක් සඳහා පමණක් පිළිතුරු සැපයිය යුතු යි.

(අ) කොටසඃ

01. කෘෂිකාර්මික උද්භිද විද්‍යාවඃ
බෝග වල වර්ගීකරණ මූලධර්ම, බෝග වර්ධන හා කායික විද්‍යාත්මක මූලධර්ම.

02. ප්‍රවේණි විද්‍යාව හා ශාක අභිජනනයඃ
මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේණි විද්‍යාව, විකෘති අනුක ප්‍රවේණිය, සෛල ප්‍රවේණි විද්‍යාව, ප්‍රමාණාත්මක ප්‍රවේණි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය, පරාගනය සහ අභිජනන සංකල්ප, විසංයෝගීතාව, මහා සහ නුමුහුන් පේලි වරණය, බහුලව භාවිත වන අභිජනන ක්‍රම හා වර්තමාන නැඹුරුව.

03. ශාක ව්‍යාධි විද්‍යාව :
ව්‍යාධිජනක ජීවී කාණ්ඩ, ආසාදන, ඒවාට පැළෑටි දක්වන සංවේදීතාව, ආසාදන ආකාර, මේවා පාලනයේ මූලධර්ම, ශාක ව්‍යාධි විද්‍යාවේ සහ රෝග පාලනය පිළිබඳව වර්තමාන නැඹුරුව, රෝග විනිශ්චය කිරීමේ තාක්ෂණික ක්‍රම, රෝග ලක්ෂණ විද්‍යාව, කොක්ගේ උපකල්පිතය, රෝග විනිශ්චයේ නව තාක්ෂණ ක්‍රම (ELISA)හා වර්තමාන නැඹුරුව.

04. කීට විද්‍යාවේ මූලධර්මඃ
සත්ත්ව වර්ගීකරණයේ මූලධර්ම, කෘමීන් වර්ග විලාසයන්, ජීවන තොරතුරු සහ හානි, කෘමි හානිවල ආර්ථික වැදගත්කම, කෘමි ගහණ හා හානි තක්සේරු කිරීම.

05. බීජ තාක්ෂණයඃ
බීජ කායික විද්‍යාව, බීජයක ව්‍යුහය, සුප්තතාව, ප්‍රරෝහණය, ජීව්‍යතාව, බීජ පරීක්ෂණ සහ පාරිශුද්ධතාව සඳහා පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථා, බීජ සහතික කිරීම, බීජ ගබඩා කිරීම.

06. පටක විද්‍යාවඃ
මූලධර්ම, පටක විද්‍යාවේ පහසුකම් හා අවශ්‍යතාව, මාධ්‍යයන්, පටක විද්‍යා රෝපණ ක්‍රම භාවිතා කරන අවස්ථා, ප්‍රාක්ප්ලාස්මීය රෝපණය, විකෘති බිහි වීම, කළල බේරා ගැනීම, නලස්ථ සංසේචනය, ජානයේ පරිණාමය, ප්‍රාක් සංරක්ෂණය.

07. කෘෂිකාර්මික රසායන විද්‍යාවඃ
ජීව රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ජීව රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, ආහාර රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ආහාර රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, විශ්ලේෂණාත්මක රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ප්‍රායෝගික භාවිතයන්

හෝ

(ආ) කොටස

01 ශෂ්‍ය විද්‍යාවඃ
කෘෂි දේශගුණික විද්‍යාව, පරිසර විද්‍යාව, භූමි සංවර්ධනය, භූමි සැකසීම, බෝග වර්ධනයේ හා කායික විද්‍යාවේ මූලධර්ම, බෝග වර්ධන මිණුම්, අස්වනු පරාමිති, පොහොර නිර්දේශ හා කාර්යක්ෂමතාව, වල් පැළෑටිවල ජීව විද්‍යාව හා පාලනය, ජල සම්පාදන ක්‍රමවල මූලධර්ම, බෝග පාංශු හා ජල සම්බන්ධතාව මූලධර්ම.

02. බෝග විද්‍යාව
වී, උස් බිම් ධාන්‍ය, මාෂ බෝග, අල බෝග හා අනෙකුත් ක්ෂේත්‍ර බෝග වල කායික විද්‍යාව, වර්ධනය ප්‍රචාරන ක්‍රම, රෝපණ ක්‍රම, බෝග පාලනයේ භෞතික, රසායන හා ජීව විද්‍යාත්මක ක්‍රම, විද්‍යාත්මක තෘණ බිම් ඇති කිරීම හා ඒවා පාලනය, දැව නිෂ්පාදන හා පලතුරු නිෂ්පාදන මූලධර්ම.

03. පාංශු විද්‍යාව:
පස නිර්මාණය, පසක භෞතික හා රසායනික ගති ලක්ෂණ, බෝග වගාවට අදාළව පසෙහි ඇති ගැටලු, පසෙහි සාරවත් බව පාලනය, ජල පෝෂණය පාලනය, පැළෑටි පෝෂක, පැළෑටි වර්ගීකරණ මූලධර්ම.

04. ප්‍රවේණි විද්‍යාව හා පැළෑටි අභිජනනය:
මූලධර්ම, මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේණිවිද්‍යාව, විකෘති, අනුක ප්‍රවේණි විද්‍යාව, සෛල ප්‍රවේණි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය

05. පැළෑටි ව්‍යාධි විද්‍යාව
පැළෑටි ආසාදන, ආසාදනවලට පැළෑටිවල සංවේදීතාව, ජෛව පාලනය, රෝග පාලනයේ නූතන ප්‍රවණතා

06. කීට විද්‍යා මූලධර්ම
(අ) ප්‍රශ්න පත්‍රයේ 04 උපඡේදය යටතේ දක්වා ඇත.

07. ක්ෂේත්‍ර පර්යේෂණ මූලධර්ම හා මූලධර්මයන් (Statistical Principles) සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි වැදගත් සංඛ්‍යා ලේඛන පිළිබඳ දැනුම.

08. කීට විද්‍යා
කෘෂිකර්මාන්තයේ දී ආර්ථික වශයෙන් වැදගත් කෘමීන්, ඔවුන්ගේ වර්ගීකරණය, බාහිර සහ අභ්‍යන්තර ගති ලක්ෂණ, විවිධ පද්ධතිවල නිර්මාණය හා ඒවායින් කෙරෙන කාර්යයන්, පළිබෝධ පාලනය, පළිබෝධ හානිවල වැදගත්කම, පළිබෝධ හඳුනා ගැනීම, ඔවුන්ගේ හානිය හා පාලනය, ඒකාබද්ධ පළිබෝධ පාලනය.

09. ක්ෂුද්‍ර ජෛව විද්‍යාව
ක්ෂුද්‍ර ජීවීන් හා කෘෂිකාර්මික පරිසරය, ජෛව තාක්ෂණය කෘෂිකර්මය සඳහා භාවිතය, පාංශු ජීවීන් හා කෘෂිකර්මාන්තයට ඔවුන්ගේ බලපෑම.

10. ජීවමිතිය හා ව්‍යවහාරික යෙදවුම් සංඛ්‍යානය:
සංඛ්‍යානය සම්බන්ධ මූලික දැනුම, කෘෂිකාර්මික පර්යේෂණ, සැලසුම් විශ්ලේෂණ, දත්තයන් ලබා ගැනීම හා ඒවා විශ්ලේෂණය කිරීම.

සටහන: විවෘත බඳවා ගැනීම් තුළින් සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) තනතුරුවලට අයදුම් කරනු ලබන සියලුම අපේක්ෂකයින් ඉහත (අ) හෝ (ආ) හි සඳහන් කොටස් 02 අතරින් කවර හෝ එක් කොටසකට පමණක් පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

II කෘෂි සංවර්ධන ධාරාව සඳහා ප්‍රශ්න පත්‍රය

01. සාමාන්‍ය කෘෂිකර්මය:
ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප, ඉඩම් සංවර්ධනය, භූමි සැකසීම හා ආම්පන්න, බෝග ස්ථාපනය හා ඒ සඳහා අවශ්‍ය කරන යන්ත්‍ර සූත්‍ර, පස හා පසෙහි සාරවත් බව, තවාන් හා තවාන් පාලනය, රෝපණ ද්‍රව්‍ය, පළිබෝධ පාලනය, පැළෑටි සංරක්ෂණය, උපකරණ, බෝග වගා ක්‍රම, ජල සම්පාදන ක්‍රම, ඒකාබද්ධ ගොවිතැන, ආරක්ෂිත කෘෂිකර්මය, ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම, අස්වැන්න නෙළීම හා අස්වැන්න නෙළන උපකරණ, පසු අස්වනු හානි, ගොවිපල් නිෂ්පාදන සකස් කිරීම, විශේෂිත ප්‍රදේශවල වගාකිරීමට සුදුසු එළවළු වර්ග, පලතුරු, පියළි බෝග සහ ධාන්‍ය තෝරාගැනීමේ දී සැලකිය යුතු කරුණු, ඒකාබද්ධ පළිබෝධ පාලනය, ඒකාබද්ධ පැළෑටි පෝෂණ පද්ධති, ශාක ආරක්ෂණ පනත, පාංශු සංරක්ෂණ පනත.

02. බෝග නිෂ්පාදනය:
ශෂ්‍ය විද්‍යාව, කෘෂි දේශගුණික සහ පරිසරය, භූමි සංවර්ධනය සහ බිම් සැකසීම, බෝගවල වැඩීමේ මූලධර්ම සහ පැළෑටි භෞතවේදය, බෝගවල වැඩීම මැනීම, අස්වනු සංරචක, පොහොර නිර්දේශ හා ඒවායේ කාර්යක්ෂමතාව, වල් පැළෑටිවල ජීව විද්‍යාව සහ පාලනය, ජල සම්පාදනය, ශෂ්‍ය විද්‍යාව, බෝග හා ජලය අතර සම්බන්ධතාවයේ මූලධර්ම.

03. ක්ෂේත්‍ර බෝගඃ
හැඳින්වීම, පාරිසරික අවශ්‍යතාවන්, ශාක විශේෂ හා ප්‍රභේද. පැළෑටි වර්ධනයේ භෞතවේදය, අස්වැන්න තීරණය කිරීමේ කායික විද්‍යාත්මක මූලධර්ම, වී බෝගයේ ශෂ්‍ය විද්‍යාව, බෝග පාලනය හා නිෂ්පාදනය, උස්බිම් ධාන්‍ය, රනිල, අල බෝග සහ වෙනත් වැදගත් ක්ෂේත්‍ර බෝග (දුම්කොළ, ලූනු, කෙඳි බෝග සහ තෙල් බෝග)

04. බෝග පාලනයඃ
අතුරු බෝග වගාව, අස්වැන්න නෙළීම හා සැකසීම

05. උද්‍යාන බෝග නිෂ්පාදනයඃ
පලතුරු නිෂ්පාදනය, පෝෂණ අගය, සමාජීය හා ආර්ථික සාධක, ආරම්භය හා ව්‍යාප්තිය, පාරිසරික අවශ්‍යතාවන්, වගා ක්‍රම, නව තාක්ෂණික ක්‍රම භාවිතය.

06. පලතුරු, එළවළු හා මල් නිෂ්පාදනයඃ
තවාන් පාලනය, උද්‍යාන පාලනය, බෝග ආශ්‍රිතව නව තාක්ෂණයන් හා වගා ක්‍රම, පලතුරු හා එළවළු බෝග වැඩිදියුණු කිරීම, පලතුරු හා එළවළු මූලික වූ බෝග වගා ක්‍රම, පසු අස්වනු හානි, පලතුරු හා එළවළුවල පසු අස්වනු හානි වළකා ගැනීම, ජෛව තාක්ෂණය, පලතුරු හා එළවළුවලට දේශීය හා විදේශීය වෙළඳ පොලවල්, නූතන සීමාවන් හා අනාගත උපාය මාර්ග, එළවළු නිෂ්පාදනය සඳහා අවශ්‍යතාවන්, එළවළු මූලික වූ බෝග වගා ක්‍රම, අලෙවිය, මල් වගා කර්මාන්තය, ප්‍රචාරන තාක්ෂණය, වගා ක්‍රම, ප්‍රශස්ත පරිමිති, භූමි අලංකරණ මූලධර්ම.

07. කෘෂිකර්ම ව්‍යාප්තිය හා පුහුණුවඃ
කෘෂිකර්ම ව්‍යාප්තිය අර්ථ දැක්වීම හා පරමාර්ථ, කෘෂිකාර්මික සංවර්ධනය හා කෘෂිකර්ම ව්‍යාප්තිය, අනුවර්තනය හා නව්‍යතා විසරණය, සන්නිවේදනය, ව්‍යාප්ති ඉගැන්වීමේ ක්‍රම, ශ්‍රී ලංකාවේ භාවිතා කෙරෙන ව්‍යාප්ති ප්‍රවේශයන්, පර්යේෂණ ව්‍යාප්ති සම්බන්ධතාව, ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීම, සමාලෝචන ඇගයීම, ශ්‍රී ලංකාවේ කෘෂි ව්‍යාප්තිය හා සම්බන්ධ වූ ආයතන, වැඩිහිටි අධ්‍යාපනය, පුහුණු කිරීමේ ක්‍රියාවලිය, පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට භාවිතා කෙරෙන විවිධ ක්‍රම, පාඩම් සැලසුම් සැකසීම, පුහුණුව ඇගයීම, පුහුණුව සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ භාවිතය.

08. බීජ තාක්ෂණයඃ
බීජ කායික විද්‍යාව, බීජ ව්‍යුහය, බීජ රූප විද්‍යාව, බීජ ප්‍රරෝහණය, බීජ ප්‍රරෝහණ ශක්තිය, බීජ පරීක්ෂා කිරීම, බීජ ප්‍රරෝහණ ශක්තිය හා පාරිශුද්ධතාව පිළිබඳ පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථාවන්, බීජ සහතික කිරීම, බීජ ගබඩා කිරීම.

09. මී මැසි පාලනය
මී මැසි ඝණාවාසයක මී මැසි වර්ග හා වද වර්ග, මී මැසි පෙට්ටිවල කොටස්, මී මැසි ඝණාවාස අල්ලා ගැනීම, තැන්පත් කිරීම, කට්ටි බෙදීම, මී මැසි ඝණාවාසයක රෝග හා පළිබෝධ.

III කෘෂි ආර්ථික විද්‍යා ධාරාව සඳහා ප්‍රශ්න පත්‍රය

01. කෘෂිකාර්මික නිෂ්පාදන ආර්ථික විද්‍යාව හා ගොවිපල පාලනය
කෘෂිකාර්මික නිෂ්පාදනයේ දී ගොවිපල පාලනයේ ඇති වැදගත්කම, මූලික සංකල්ප, නිෂ්පාදන ශ්‍රිතය, නිෂ්පාදන ශ්‍රිතයන්හි ස්වරූප , නිෂ්පාදන ශ්‍රිතයේ හැඩය, නිෂ්පාදන උපේක්ෂා වක්‍ර ත්වරණය, සම ආදායම් රේඛාව, උපයන සම්පත් සම්බන්ධතාව හා පිරිවැය අවම ප්‍රමාණයට අවදානම පිළිබඳ මූලධර්ම, හීනවන ඵලදා න්‍යාය, ආදේශය හා ආදායම් ප්‍රතිචාපක කෘෂිකර්මයේ ඇති අවදානම හා අඩමානයට මුහුණ දීම සඳහා නිෂ්පාදන සකස් කිරීමේ නැමියාව හා විවිධාංගීකරණය, කෘෂිකාර්මික මිල නියම කිරීමට අදාළ වන පරිදි මිල න්‍යාය, බෝග සහ සත්ත්ව සංයෝග අගය කිරීම, ගොවිපල් ප්‍රමාණය හා පරිමාණානුකූල ඵල, පවුල් ගොවිපලවල වැදගත්කම හා සාපේක්ෂ වාසිය පිළිබඳ මූලධර්ම, ගොවිපල් යාන්ත්‍රීකරණයේ ශක්තිමත් හා දුර්වල කරුණු නිර්ණය කිරීමේ දී වාර්තාවල ඇති වැදගත්කම හා උපරිම කරන ආකෘති සඳහා මෙම තොරතුරු ඇතුළත් කිරීම.

02. කෘෂිකාර්මික අලෙවිය
අලෙවි කිරීමේ මූලධර්ම, නිෂ්පාදනයේ හා අලෙවියේ සාපේක්ෂ වැදගත්කම, ශ්‍රී ලංකාව් අලෙවිය පිළිබඳ කටයුතු කරන ආයතන, අලෙවි මාර්ග වර්ධනය කෙරෙහි බලපෑමක් ඇති කිරීමෙහි ලා එවැනි ආයතනයක කාර්යභාරය, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේ දී මුහුණ පෑමට සිදුවන ගැටලු හා අලෙවි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට අදාළ මූලධර්ම.

03. ඉඩම් ආර්ථික විද්‍යාව
ආර්ථික විද්‍යාත්මක සංකල්ප ඉඩම් පරිශීලනයට බලපාන අයුරු, ශ්‍රී ලංකාවේ ඉඩම් සඳහා ඉල්ලුම හා සැපයුම, ඉඩම් පරිශීලන කටයුතු ශ්‍රී ලංකාවේ සැලසුම් කරන අයුරු, ශ්‍රී ලංකාවේ ගොවි ජනපද පිහිටුවීමේ හා මිනිසුන් පදිංචි කරවීමේ වැඩසටහනේ වැදගත්කම.

*දෙවන පරිශිෂ්ටය*

*සීමිත තරග විභාග රෙගුලාසි හා විෂයය නිර්දේශය*

1 වන ප්‍රශ්න පත්‍රය - බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය
භාෂාමය, ගණිතමය හා තර්කන හැකියාව මැන බැලීම සඳහා ප්‍රශ්න ඇතුළත් බහුවරණ කෙටි ප්‍රශ්න පත්‍රයකි. කාලය පැය 1 1 /4 කි. මුළු ලකුණු සංඛ්‍යාව 100 කි.

2 වන පත්‍රය - විෂයානුබද්ධ දැනුම මැන බැලීම
මෙය නියම කර ඇති විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම මැන බැලීම සඳහා පවත්වනු ලබන තනතුරට අදාළ ලිඛිත අභියෝගිතා පරීක්ෂණයකි. එක් එක් අයදුම්කරුවෙකු විසින් තමන් ඉල්ලුම් කරනු ලබන තනතුරට හෝ තනතුරුවලට අදාළ වන පරිදි පහත සඳහන් ප්‍රශ්න පත්‍ර අතුරින් තෝරා ගනු ලබන ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටීමට අවකාශ ඇත. මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න හා බහුවරණ ප්‍රශ්නවලින් යුක්ත වේ. කාලය පැය 2 ක් වන අතර මුළු ලකුණු සංඛ්‍යාව 100ක් වේ.

සටහන:- පහත සඳහන් විෂය නිර්දේශය අනුව සීමිත විභාගයේ දී විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය ක්ෂේත්‍රයේ පළපුරුද්දට වැඩි නැඹුරුවක් වන සේ සකස් කරනු ලැබේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරන ආකාරයට විභාගය පවත්වනු ලැබේ.

එක් එක් තනතුරට අදාළ විෂයය නිර්දේශයන් පහත දැක්වේ.

I. කෘෂි පර්යේෂණ ධාරාව සඳහා ප්‍රශ්න පත්‍රය:
අයදුම්කරුවන්ගේ මනාපය පරිදි පහත (අ) සහ (ආ)හි සඳහන් කොටස් 02 අතරින් එක් කොටසක් සඳහා පමණක් පිළිතුරු සැපයිය යුතු යි.

(අ) කොටස:

01 කෘෂිකාර්මික උද්භිද විද්‍යාව:
බෝගවල වර්ගීකරණ මූලධර්ම, බෝග වර්ධන හා කායික විද්‍යාත්මක මූලධර්ම.

02. ප්‍රවේණි විද්‍යාව හා ශාක අභිජනනය:
මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේණි විද්‍යාව, විකෘති අනුක ප්‍රවේණිය, සෛල ප්‍රවේණි විද්‍යාව, ප්‍රමාණාත්මක ප්‍රවේණි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය, පරාගනය සහ අභිජනන සංකල්ප, විසංයෝගීතාව, මහා සහ නුමුහුන් පේලි වරණය බහුලව භාවිතා වන අභිජනන ක්‍රම හා වර්තමාන නැඹුරුව.

03. ශාක ව්‍යාධි විද්‍යාව:
ව්‍යාධි ජනක ජීවී කාණ්ඩ, ආසාදන, ඒවාට පැළෑටි දක්වන සංවේදීතාව, ආසාදන ආකාර හා පාලන මූලධර්ම, ශාක ව්‍යාධි විද්‍යාවේ සහ රෝග පාලනය පිළිබඳ වර්තමාන නැඹුරුව, රෝග විනිශ්චය කිරීමේ තාක්ෂණික ක්‍රම, රෝග ලක්ෂණ විද්‍යාව, කොක්ගේ උපකල්පිතය රෝග විනිශ්චයේ නව තාක්ෂණ ක්‍රම (ELISA) හා වර්තමාන නැඹුරුව.

04. කීට විද්‍යාවේ මූලධර්ම:
සත්ත්ව වර්ගීකරණ මූලධර්ම, කෘමීන් වර්ග විලාසයන්, ජීවන තොරතුරු සහ හානි, කෘමි හානිවල ආර්ථික වැදගත්කම, කෘමි ගහණ හා හානි තක්සේරු කිරීම.

05. බීජ තාක්ෂණය:
බීජ කායික විද්‍යාව, බීජයක ව්‍යුහය, සුප්තතාව, ප්‍රරෝහණ ජීව්‍යතාව, බීජ පරීක්ෂණ සහ පාරිශුද්ධතාව සඳහා පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථා, බීජ සහතික කිරීම, බීජ ගබඩා කිරීම.

06. පටක විද්‍යාවඃ
මූලධර්ම, පටක විද්‍යාවේ පහසුකම් හා අවශ්‍යතාව, මාධ්‍යයන්, පටක විද්‍යා රෝපණ ක්‍රම භාවිතා කරන අවස්ථා, ප්‍රාක්ප්ලාස්මීය රෝපණය, විකෘති බිහි වීම, කළල බේරා ගැනීම, නලස්ථ සංසේචනය, ජානයේ පරිණාමය, ප්‍රාක් සංරක්ෂණය.

08. කෘෂිකාර්මික රසායන විද්‍යාවඃ

ජීව රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ජීව රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, ආහාර රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ආහාර රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, විශ්ලේෂණාත්මක රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ප්‍රායෝගික භාවිතයන්

හෝ

(ආ) කොටස

01 ශෂ්‍ය විද්‍යාව
කෘෂි දේශගුණික විද්‍යාව, පරිසර විද්‍යාව, භූමි සංවර්ධනය, භූමි සැකසීම, බෝග වර්ධනයේ හා කායික විද්‍යාවේ මූලධර්ම, බෝග වර්ධන මිනුම්, අස්වනු පරාමිති, පොහොර නිර්දේශ හා කාර්යක්ෂමතාව, වල් පැළෑටිවල ජීව විද්‍යාව හා පාලනය, ජල සම්පාදන ක්‍රමවල මූලධර්ම, බෝග පාංශු හා ජල සම්බන්ධතා මූලධර්ම.

02. බෝග විද්‍යාව
වී, උස් බිම් ධාන්‍ය, මාෂ බෝග, අල බෝග හා අනෙකුත් ක්ෂේත්‍ර බෝග වල කායික විද්‍යාව, වර්ධන ප්‍රචාරණ ක්‍රම, රෝපණ ක්‍රම, බෝග පාලනයේ භෞතික, රසායන හා ජීව විද්‍යාත්මක ක්‍රම, විද්‍යාත්මක තෘණ බිම් ඇති කිරීම හා ඒවා පාලනය, දැව නිෂ්පාදන හා පලතුරු නිෂ්පාදන මූලධර්ම.

03. පාංශු විද්‍යාවඃ
පස නිර්මාණය, පසක භෞතික හා රසායනික ගති ලක්ෂණ, බෝග වගාවට අදාළව පසෙහි ඇති ගැටලු, පසෙහි සාරවත් බව පාලනය, ජල පෝෂක පාලනය, පැළෑටි පෝෂණය, පැළෑටි වර්ගීකරණ මූලධර්ම.

04. ප්‍රවේණි විද්‍යාව හා පැළෑටි අභිජනනයඃ
මූලධර්ම, මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේණි විද්‍යාව, විකෘති, අනුක ප්‍රවේණි විද්‍යාව, සෛල ප්‍රවේණි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය.

05. පැළෑටි ව්‍යාධි විද්‍යාව
පැළෑටි ආසාදන, ආසාදනවලට පැළෑටිවල සංවේදීතාව, ජෛව පාලනය, රෝග පාලනයේ නූතන ප්‍රවණතා.

06. කීට විද්‍යා මූලධර්ම

(අ) ප්‍රශ්න පත්‍රයේ 04 උපඡේදය යටතේ දක්වා ඇත.

07. ක්ෂේත්‍ර පර්යේෂණ මූලධර්ම හා මූලධර්මයන් (Statistical Principles) සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි වැදගත් සංඛ්‍යා ලේඛන පිළිබඳ දැනුම.

08. කීට විද්‍යාව
කෘෂිකර්මාන්තයේ දී ආර්ථික වශයෙන් වැදගත් කෘමීන්, ඔවුන්ගේ වර්ගීකරණය, බාහිර සහ අභ්‍යන්තර ගති ලක්ෂණ, විවිධ පද්ධතිවල නිර්මාණය හා ඒවායින් කෙරෙන කාර්යයන්, පළිබෝධ පාලනය, පළිබෝධ හානිවල වැදගත්කම, පළිබෝධකයින් හඳුනා ගැනීම, ඔවුන්ගේ හානිය හා පාලනය, ඒකාබද්ධ පළිබෝධ පාලනය

09. ක්ෂුද්‍ර ජෛව විද්‍යාව
ක්ෂුද්‍ර ජීවීන් හා කෘෂිකාර්මික පරිසරය, ජෛව තාක්ෂණය කෘෂිකර්මය සඳහා භාවිතය, පාංශු ජීවීන් හා කෘෂිකර්මයට ඔවුන්ගේ බලපෑම

10. ජීවමිතිය හා ව්‍යවහාරික යෙදවුම් සංඛ්‍යානයඃ
සංඛ්‍යානය සම්බන්ධ මූලික දැනුම, කෘෂිකාර්මික පර්යේෂණ, සැලසුම් විශ්ලේෂණය, දත්ත ලබා ගැනීම හා ඒවා විශ්ලේෂණය කිරීම.

සටහනඃ සීමිත බඳවා ගැනීම් තුළින් සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) තනතුරුවලට අයදුම් කරනු ලබන සියලුම අපේක්ෂකයින් ඉහත (අ) හෝ (ආ) හි සඳහන් කොටස් 02 අතරින් කවර හෝ එක් කොටසකට පමණක් පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

II කෘෂි සංවර්ධන ධාරාව තනතුර සඳහා ප්‍රශ්න පත්‍රය

01. සාමාන්‍ය කෘෂිකර්මයඃ
ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප, ඉඩම් සංවර්ධනය, භූමි සැකසීම හා ආම්පන්න, බෝග ස්ථාපනය හා ඒ සඳහා අවශ්‍ය කරන යන්ත්‍ර සූත්‍ර, පස හා පසෙහි සාරවත් බව, තවාන් හා තවාන් පාලනය, රෝපණ ද්‍රව්‍ය, පළිබෝධ පාලනය, පැළෑටි සංරක්ෂණය, උපකරණ, බෝග වගා ක්‍රම, ජල සම්පාදන ක්‍රම, ඒකාබද්ධ ගොවිතැන, ආරක්ෂිත කෘෂිකර්මය, ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම, අස්වැන්න නෙළීම හා අස්වැන්න නෙළන උපකරණ, පසු අස්වනු හානි, ගොවිපල් නිෂ්පාදන සකස් කිරීම, විශේෂිත ප්‍රදේශවල වගාකිරීමට සුදුසු එළවළු වර්ග, පලතුරු, පියලි බෝග සහ ධාන්‍ය තෝරා ගැනීමේ දී සැලකිය යුතු කරුණු, ඒකාබද්ධ පළිබෝධ පාලනය, ඒකාබද්ධ පැළෑටි පෝෂණ පද්ධති, ශාක ආරක්ෂණ පනත, පාංශු සංරක්ෂණ පනත.

02. බෝග නිෂ්පාදනයඃ
ශෂ්‍ය විද්‍යාව, කෘෂි දේශගුණික සහ පරිසරය, භූමි සංවර්ධනය සහ බිම් සැකසීම බෝගවල වැඩීමේ මූලධර්ම සහ පැළෑටි භෞතවේදය, බෝගවල වැඩීම මැනීම, අස්වනු සංරචක, පොහොර නිර්දේශ හා ඒවායේ කාර්යක්ෂමතාව, වල් පැළෑටිවල ජීව විද්‍යාව සහ පාලනය, ජල සම්පාදනය, ශෂ්‍ය විද්‍යාව, බෝග හා ජලය අතර සම්බන්ධතා මූලධර්ම.

03. ක්ෂේත්‍ර බෝගඃ
හැඳින්වීම, පාරිසරික අවශ්‍යතාවන්, ශාක විශේෂ හා ප්‍රභේද, පැළෑටි වර්ධනයේ භෞතවේදය, අස්වැන්න තීරණය කිරීමේ කායික විද්‍යාත්මක මූලධර්ම, වී බෝගයේ ශෂ්‍ය විද්‍යාව, බෝග පාලනය හා නිෂ්පාදනය, උස්බිම් ධාන්‍ය, රනිල, අල බෝග සහ වෙනත් වැදගත් ක්ෂේත්‍ර බෝග (දුම්කොළ, ලූනු, කෙඳි බෝග සහ තෙල් බෝග)

04. බෝග පාලනයඃ
අතුරු බෝග වගාව, අස්වැන්න නෙළීම හා සැකසීම.

05. උද්‍යාන බෝග නිෂ්පාදනයඃ
පලතුරු නිෂ්පාදනය, පෝෂණ අගය, සමාජීය හා ආර්ථික සාධක, ආරම්භය හා ව්‍යාප්තිය, පාරිසරික අවශ්‍යතාවන්, වගා ක්‍රම, නව තාක්ෂණික ක්‍රම භාවිතය.

06. පලතුරු, එළවළු හා මල් නිෂ්පාදනයඃ
තවාන් පාලනය, උද්‍යාන පාලනය, බෝග ආශ්‍රිතව නව තාක්ෂණයන් හා වගා ක්‍රම, පලතුරු හා එළවළු බෝග වැඩිදියුණු කිරීම, පලතුරු හා එළවළු මූලික වූ බෝග වගා ක්‍රම, පසු අස්වනු හානි, පලතුරු හා එළවළුවල පසු අස්වනු හානි වළකා ගැනීම, ජෛව තාක්ෂණය, පලතුරු හා එළවළුවල දේශීය හා විදේශීය වෙළඳ පොළවල් නූතන සීමාවන් හා අනාගත උපාය මාර්ග, එළවළු නිෂ්පාදනය සඳහා අවශ්‍යතාවන්, එළවළු මූලික වූ බෝග වගා ක්‍රම, අළෙවිය, මල් වගා කර්මාන්තය, ප්‍රචාරන තාක්ෂණය, වගා ක්‍රම, ප්‍රශස්ත පරිමිති , භූමි අලංකරණ මූලධර්ම.

07. කෘෂිකර්ම ව්‍යාප්තිය හා පුහුණුවඃ
කෘෂිකර්ම ව්‍යාප්තිය අර්ථ දැක්වීම හා පරමාර්ථ, කෘෂිකාර්මික සංවර්ධනය හා කෘෂිකර්ම ව්‍යාප්තිය, අනුවර්තනය හා නව්‍යතා විසරණය, සන්නිවේදනය, ව්‍යාප්ති ඉගැන්වීමේ ක්‍රම, ශ්‍රී ලංකාවේ භාවිත කෙරෙන ව්‍යාප්ති ප්‍රවේශයන්, පර්යේෂණ ව්‍යාප්ති සම්බන්ධතාව, ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීම, සමාලෝචන ඇගයීම , ශ්‍රී ලංකාවේ කෘෂි ව්‍යාප්තිය හා සම්බන්ධ වූ ආයතන, වැඩිහිටි අධ්‍යාපනය, පුහුණු කිරීමේ ක්‍රියාවලිය, පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට භාවිත කෙරෙන විවිධ ක්‍රම, පාඨම් සැලසුම් සැකසීම, පුහුණුව ඇගයීම, පුහුණුව සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ භාවිතය.

08. බීජ තාක්ෂණයඃ
බීජ කායික විද්‍යාව, බීජ ව්‍යුහය, බීජ රූප විද්‍යාව, බීජ ප්‍රරෝහණය, බීජ ප්‍රරෝහණය ශක්තිය, බීජ පරික්ෂා කිරීම, බීජ ප්‍රරෝහණ ශක්තිය හා පාරිශුද්ධතාව පිළිබඳ පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථාවන්, බීජ සහතික කිරීම, බීජ ගබඩා කිරීම.

09. මී මැසි පාලනය
මී මැසි ගණාවාසයක මී මැසි වර්ග හා වද වර්ග, මී මැසි පෙට්ටිවල කොටස්, මී මැසි ගණාවාස අල්ලා ගැනීම, තැන්පත් කිරීම, කට්ටි බෙදීම, මී මැසි ඝණාවාසයක රෝග හා පළිබෝධ.

III. කෘෂි ආර්ථික විද්‍යා ධාරාව සඳහා ප්‍රශ්න පත්‍රය

01. කෘෂිකාර්මික නිෂ්පාදන ආර්ථික විද්‍යාව හා ගොවිපල් පාලනය
කෘෂිකාර්මික නිෂ්පාදනයේ දී ගොවිපල් පාලනයේ ඇති වැදගත්කම, මූලික සංකල්ප, නිෂ්පාදන ශ්‍රිතය, නිෂ්පාදන ශ්‍රිතයන්හි ස්වරූප, නිෂ්පාදන ශ්‍රිතයේ හැඩය, නිෂ්පාදන උපේක්ෂා වක්‍ර ත්වරණය, සම ආදායම් රේඛාව, උපයන සම්පත් සම්බන්ධතාව හා පිරිවැය අවම ප්‍රමාණයට අවදානම පිළිබඳ මූලධර්ම, හීනවන ඵලදා න්‍යාය, ආදේශය හා ආදායම් ප්‍රතිවාපක කෘෂිකර්මාන්තයේ ඇති අවදානම හා අඩමානයට මුහුණ දීම සඳහා නිෂ්පාදන සකස් කිරීමේ නැම්යාව හා විවිධාංගීකරණය, කෘෂිකාර්මික මිල නියම කිරීමට අදාළ වන පරිදි මිල න්‍යාය, බෝග සහ සත්ත්ව සංයෝග අගය කිරීම, ගොවිපල් ප්‍රමාණය හා පරිමාණානුකූල ඵල, පවුල් ගොවිපලවල වැදගත්කම හා සාපේක්ෂ වාසිය පිළිබඳ මූලධර්ම, ගොවිපල් යාන්ත්‍රීකරණයේ ශක්තිමත් හා දුර්වල කරුණු නිර්ණය කිරීමේ දී වාර්තාවල ඇති වැදගත්කම හා උපරිම කරන ආකෘති සඳහා මෙම තොරතුරු ඇතුළත් කිරීම.

02. කෘෂිකාර්මික අළෙවිය
අළෙවි කිරීමේ මූලධර්ම, නිෂ්පාදනයේ හා අළෙවියේ සාපේක්ෂ වැදගත්කම, ශ්‍රී ලංකාවේ අළෙවිය පිළිබඳ කටයුතු කරන ආයතන, අලෙවි මාර්ග වර්ධනය කෙරෙහි බලපෑමක් ඇති කිරීමෙහි ලා එවැනි ආයතනයක කාර්යභාරය, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන අළෙවි කිරීමේ දී මුහුණ පෑමට සිදුවන ගැටලු හා අළෙවි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට අදාළ මූලධර්ම.

03. ඉඩම් ආර්ථික විද්‍යාව
ආර්ථික විද්‍යාත්මක සංකල්ප ඉඩම් පරිශීලනයට බලපාන අයුරු, ශ්‍රී ලංකාවේ ඉඩම් සඳහා ඉල්ලුම හා සැපයුම, ඉඩම් පරිශීලන කටයුතු ශ්‍රී ලංකාවේ සැලසුම් කරන අයුරු, ශ්‍රී ලංකාවේ ගොවි ජනපද පිහිටුවීමේ හා මිනිසුන් පදිංචි කරවීමේ වැඩසටහනේ වැදගත්කම.

***තුන්වන පරිශිෂ්ටය***

*III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ*
*විෂයය නිර්දේශය හා ප්‍රශ්න පත්‍ර*

01. මෙම පරීක්ෂණය පහත සඳහන් කර ඇති පරිදි ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විත වේ.

| | | | |
|---|---|---|---|
| (I) වන පත්‍රය | - | මූල්‍ය ක්‍රම | (පැය 1 1/2) |
| (II) වන පත්‍රය | - | පරිපාලනය | (පැය 3) |
| (III) වන පත්‍රය | - | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සංවිධානය | (පැය 3) |

02. ප්‍රශ්න පත්‍ර I සහ II සඳහා පෙනී සිටින ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරීන් විභාග කොමසාරිස් ජනරාල් විසින් වාර්ෂිකව පවත්වනු ලබන ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරීන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ දී මෙම ප්‍රශ්න පත්‍රයන්ට පෙනී සිටිය යුතු ය. විභාගය පැවැත්වෙන දිනයන් හා එහි කාල සටහන පිළිබඳ විස්තර විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් දන්වා එවනු ඇත. කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් මෙම විභාගයට අයදුම් පත්‍ර කැඳවන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනවලට අනුකූලව එකී විභාග සඳහා කල් ඇතිව අයදුම් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. IIIවන ප්‍රශ්න පත්‍රය පිළිබඳ පරීක්ෂණය කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලැබේ.

03. මෙම විභාගය පැවැත්වෙන දිනයන් හා කාලසටහන් පිළිබඳ විස්තර අධ්‍යක්ෂ ජනරාල් විසින් දෙපාර්තමේන්තුවේ වාර්ෂික විභාග කාලසටහන මඟින් දැනුම් දෙනු ඇත. එම දැනුම් දීමට අනුකූලව අදාළ පරීක්ෂණ සඳහා කල් ඇතිව අයදුම් කිරීම ද අපේක්ෂකයින් සතු වගකීමකි.

04. සාමාර්ථය සඳහා අයදුම්කරුවන් එක් එක් ප්‍රශ්න පත්‍රයකින් සමත් වීමට අවම වශයෙන් ලකුණු 40% බැගින් ලබා ගත යුතු වේ.

05. නිලධාරීන් විසින් තමන්ට රුචි පරිදි එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී ප්‍රශ්න පත්‍ර 03ට පෙනී සිටිය හැකි ය.

**විෂය නිර්දේශ මාලාව**

***Iවන පත්‍රය- මූල්‍ය ක්‍රම***

මූල්‍ය ක්‍රම ගැන ප්‍රශ්න පත්‍රය පහත සඳහන් කරුණු මත පදනම් වේ.

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි Iවැනි කාණ්ඩය (x වැනි පරිච්ඡේදය හැර)
(ආ) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තු-
උදා - ඒවා සකස් කිරීම ශීර්ෂ මූල්‍ය ක්‍රම හා විසර්ජන පනත්.

සටහන- සාමාර්ථය සඳහා අවම වශයෙන් මුළු ලකුණුවලින් 40% ක් අපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතු ය.

***IIවන පත්‍රය - පරිපාලනය***

පරිපාලනය පිළිබඳ ප්‍රශ්න පත්‍රය පහත සඳහන් කරුණු මත පදනම් වේ.

(අ) කාර්යාල හා ක්ෂේත්‍ර සංවිධාන ක්‍රම

(ආ) ආයතන සංග්‍රහය- පරිච්ඡේද VI, VII, IX, XIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති කාර්ය පටිපාටික රීති සංග්‍රහය

සටහන - සාමාර්ථයන් සඳහා අවම වශයෙන් මුළු ලකුණුවලින් 40% ක් අපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතු ය.

***IIIවන පත්‍රය - ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවිධානය***

පළමු කොටස - රාජ්‍ය අංශය සහ ජාතික මට්ටමින් කෘෂිකාර්මික ප්‍රතිපත්ති සැලසුම් කිරීම.

(I) කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශය සහ එහි කාර්යයන්
(II) අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා අදාළ වගකීම්

පහත දැක්වෙන කරුණු සම්බන්ධ ප්‍රතිපත්ති:
කෘෂිකාර්මික සංවර්ධනය, ඉඩම් භුක්තිය හා ඉඩම් ප්‍රතිසංස්කරණය, යෙදවුම් සැපයීම් හා නිමවුම් ගොවිපලෙන් යැවීම, කෘෂිකාර්මික නිෂ්පාදනය හා කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ ආනයනය හා අපනයනය, පැළ ද්‍රව්‍ය ආනයනය කිරීම, කෘෂිකාර්මික නිෂ්පාදනය, කෘෂි නිෂ්පාදනවල මිල නියම කිරීම, මිල ආධාරක හා සැපයීම්, ඉඩම් අයිතිය හා භාවිතය සම්බන්ධ ප්‍රතිපත්තිවලට අදාළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන පනත් හා නීති රීති සහ කෘෂිකාර්මික ණය සම්බන්ධ ප්‍රතිපත්ති, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ වූ සියලුම දෙපාර්තමේන්තු, මණ්ඩල සහ ආයතන.

දෙවන කොටස - කෘෂිකාර්මික සංවර්ධනයට අදාළ වෙනත් අමාත්‍යාංශ හා රජයේ ආයතන, කෘෂිකාර්මික සංවර්ධනයට අදාළ විධිවිධාන, සංවිධාන හා ආයතනවල පරමාර්ථ හා කාර්යයන් පිළිබඳ අධ්‍යයනයක්.

ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, රබර් පර්යේෂණ ආයතනය, පොල් සංවර්ධන අධිකාරිය, මහවැලි අධිකාරිය, පළාත් සභා ව්‍යුහය, දිස්ත්‍රික් පරිපාලනය, ප්‍රාදේශීය පරිපාලනය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල, රාජ්‍ය අංශයේ බැංකු ක්‍රම හා මුදල් ආයතන, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ගොවිජන කේන්ද්‍ර. (කෘෂිකාර්මික හා සත්ත්ව පාලන සංවර්ධනයෙහි ලා ඒවා සතු මෙහෙය.)

තුන්වන කොටස - පෞද්ගලික අංශය

1. අපනයන කෘෂිකාර්මික ව්‍යාපාරය

(අ) තේ
(ආ) රබර්
(ඇ) පොල්
(ඈ) අපනයන කෘෂිකර්ම බෝග
(ඉ) වෙනත් නිෂ්පාදන

2. දේශීය කෘෂිකර්මය

(අ) වී
(ආ) උද්‍යාන විද්‍යා බෝග ඇතුළු උස් බිම් බෝග
(ඇ) වෙනත් කෘෂිකාර්මික බෝග

3. පෞද්ගලික අංශයේ (රාජ්‍ය නො වන) සංවිධාන

(අ) සාමුහික, සමූපකාර හා කණ්ඩායම් ගොවිපල්
(ආ) ප්‍රමාණ වර්ගීකරණය අනුව අයිතිකරු විසින් පවත්වාගෙන යන ගොවිපල්

4. පෞද්ගලික අංශයේ බැංකු ක්‍රම හා මූල්‍ය සමාගම්

(අ) කෘෂිකර්ම සංවර්ධනයෙහි ලා ඒවා සතු කාර්යභාරය

හතරවැනි කොටස - කෘෂිකාර්මික සංවර්ධන හා නිෂ්පාදන වැඩසටහන් පිළියෙල කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම.

1. කෘෂිකාර්මික සංවර්ධනය හා කෘෂිකාර්මික සැලසුම් කිරීමේ කාර්යභාරය
2. සැලසුම් කිරීමේ හා වැඩසටහන් පිළියෙල කිරීමේ කාර්ය පටිපාටිය
3. කෘෂිකාර්මික ව්‍යාපෘති පිළියෙල කිරීම හා හඳුන්වාදීම
4. ක්‍රියාත්මක කිරීමේ කාර්ය පටිපාටිය
5. ප්‍රගති නිරීක්ෂණය හා ඇගයීම

*හතරවැනි පරිශිෂ්ටය*

*II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ*
*විෂයය නිර්දේශය හා ප්‍රශ්න පත්‍ර*

*දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පිළිබඳ විස්තර පහත දැක්වේ*

01. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 8.3වැනි උප වගන්තියේ සඳහන් කෘෂිකාර්මික විද්‍යාව පිළිබඳ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව පවත්වනු ලැබේ.

02. මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොටස් දෙකකින් සමන්විත වේ. කොටස් දෙකට එකවර හෝ වෙන් වෙන් වශයෙන් හෝ පෙනී සිටීමට අයදුම්කරුවෙකුට අවසර ඇතත්, අවුරුදු තුනක අනුපූර්ව කාලයක් ඇතුළත ඔහු හෝ ඇය විසින් විභාගය සම්පූර්ණ කළ යුතු වන්නේ ය.

03. මෙම විභාගයේ පළමු වැනි කොටස පැය තුනක කාලයක් සහිත ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර, අයදුම්කරුවෙකු විසින් ප්‍රශ්න පත්‍ර දෙකෙන් ම සමත් විය යුතු ය. එසේ සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් අවම වශයෙන් 40%ක් ලකුණු ලබා ගත යුතු ය.

04. මෙම විභාගයේ දෙවැනි කොටස පැය තුනක කාලයක් සහිත ප්‍රශ්න පත්‍ර දහ හතකින් යුක්ත වන අතර, සෑම අයදුම්කරුවෙකු විසින්ම ඉන් දෙකකින් සමත් විය යුතු ය. එසේ සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් අවම වශයෙන් 40% ක් ලකුණු ලබා ගත යුතු ය.

05. IIවැනි කොටසේ අංක 3, 7 හා 8 දරන ප්‍රශ්න පත්‍ර අතරින් අයදුම්කරුවෙකුට පෙනී සිටිය හැක්කේ එක් ප්‍රශ්න පත්‍රයකට පමණි.

06. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ 1වැනි හා 2වැනි කොටස් පහත සඳහන් ප්‍රශ්න පත්‍ර වලින් යුක්ත වේ.

1වැනි කොටස

1වැනි පත්‍රය - කෘෂිකාර්මික සංවර්ධනය
2වැනි පත්‍රය - බෝග නිෂ්පාදනය

11වැනි කොටස

1වැනි පත්‍රය - කෘෂිකාර්මික ව්‍යාප්තිය හා අධ්‍යාපනය
(අ) කොටස - කෘෂිකාර්මික ව්‍යාප්තිය
(ආ) කොටස - කෘෂිකාර්මික අධ්‍යාපනය හා පුහුණුව

2වැනි පත්‍රය - පාංශු හා ජල කළමනාකරණය
3වැනි පත්‍රය - පැළෑටි සංරක්ෂණය
4වැනි පත්‍රය - බීජ තාක්ෂණ ක්‍රම
(අ) වැනි කොටස - බීජ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
(ආ) වැනි කොටස - බීජ විද්‍යාව හා තාක්ෂණය

5වැනි පත්‍රය- ශෂ්‍ය විද්‍යාව
6වැනි පත්‍රය- කෘෂිකාර්මික රසායන විද්‍යාව
7වැනි පත්‍රය- කීට විද්‍යාව
8වැනි පත්‍රය- පැළෑටි ව්‍යාධි විද්‍යාව
9වැනි පත්‍රය- උද්‍යාන විද්‍යාව
10වැනි පත්‍රය- කෘෂිකාර්මික නිෂ්පාදන, ආර්ථික විද්‍යාව හා ගොවිපල් පාලනය
11වැනි පත්‍රය- කෘෂිකාර්මික අළෙවිය
12වැනි පත්‍රය- ශාක අභිජනනය හා ප්‍රවේණි විද්‍යාව
13වැනි පත්‍රය- පැළෑටි භෞතවේදය
14වැනි පත්‍රය- කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව
15වැනි පත්‍රය- මල් වගාව හා උද්‍යාන අලංකරණය
(අ) වැනි කොටස - සාමාන්‍ය මල් වගාව
(ආ) වැනි කොටස - නාගරික උද්‍යාන විද්‍යාව හා උද්‍යාන අලංකරණය

16වැනි පත්‍රය- ආහාර විද්‍යාව
17වැනි පත්‍රය- පෝෂණය සෞඛ්‍ය විද්‍යාව

07. ඉහත අංක 06 යටතේ සඳහන් එක් එක් ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය පහත දැක් වේ.

**දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ පළමු කොටසට අදාළ ප්‍රශ්න පත්‍රවල විෂය නිර්දේශයන්**

**1වැනි ප්‍රශ්න පත්‍රය - කෘෂිකාර්මික සංවර්ධනය**

**ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කෘෂිකාර්මික අංශයේ ස්වභාවය හා වැදගත්කම:**

ශ්‍රී ලංකා කෘෂිකර්මාන්තයේ පවතින ප්‍රධාන ගැටලු, ශ්‍රී ලංකා කෘෂිකාර්මික අංශයේ ස්වභාවය හා එක් එක් අංශයෙහි වැදගත්කම, කෘෂිකාර්මික ඵලදායිතාවට අදාළ නීති, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කටයුතුවලට අදාළ වන පාර්ලිමේන්තු පනත්, ශ්‍රී ලංකාව තුළ කෘෂි අළෙවිය, ශ්‍රී ලංකාව මුහුණ පාන ගැටලු, කෘෂිකර්මාන්තය ගැන සැලකිලිමත් වන කෘෂිකාර්මික ආයතන හා රටේ කෘෂිකාර්මික සංවර්ධනය කෙරෙහි ඒවායේ බලපෑම, කෘෂිකාර්මික වෙළඳාමෙහි වැදගත්කම හා අන්තර්ජාතික කෘෂිකාර්මික වෙළඳපොළෙහි ශ්‍රී ලංකාවේ තත්ත්වය

2වැනි ප්‍රශ්න පත්‍රය - බෝග නිෂ්පාදනය

ශෂ්‍ය පාලනයේ මූලධර්මඃ බෝග නිෂ්පාදනයේ මූලධර්ම කෙරෙහි දැඩි අවධානය යොමු කරමින් වැදගත් ධාන්‍ය බෝග, රනිල බෝග, කෙඳි හා සත්ත්ව ආහාර බෝග හා වෙනත් ආර්ථික බෝග වර්ගීකරණය, බෙදා හැරීම, හඳුනා ගැනීම හා වගා කිරීම, වී, බඩ ඉරිඟු, සෝගම් හා මිලට් ඇතුළු බෝග වගා කිරීම, බෙදා හැරීම, ගබඩා කිරීම, වර්ගීකරණය හා වැඩිදියුණු කිරීම.

තණ බිම් හා ගෝචර බෝගඃ සංස්ථාපනය කිරීමේ ක්‍රම, කළමනාකරණය, සංරක්ෂණය, උපයෝගීතාව, වල් පැළෑටි පාලනය හා පෝෂණ ගුණය ඇතුළත් වන ගෝචර ශාක හා තෘණ බිම් වගා කිරීම හා හොඳ ලක්ෂණ සහිත ගෝචර ශාක හා තෘණ ශාක විශේෂ හා ඒවායේ ලක්ෂණ.

බීජ තාක්ෂණයඃ බීජ පාරිශුද්ධතාව, බීජ පරීක්ෂණය, ප්‍රරෝපණය, බීජ අක්‍රීයතාව හා උපකරණ පිළිබඳ හැඳින්වීමක් සහිතව බීජ ශ්‍රේණිගත කිරීමේ මූලිකාංග හඳුනා ගැනීම හා බීජ ඇගයීම, බෝගවල ලක්ෂණ, වල් පැළෑටි රෝග හා බීජවලට ගුණාත්මක බවට බලපාන වෙනත් කරුණු.

පාංශු විද්‍යාවේ මූලධර්මඃ ශ්‍රී ලංකාවේ පස් වර්ගවල ආරම්භය, ඒවා සෑදී ඇති අන්දම, සංයුතිය හා වර්ගීකරණය, පැළෑටි වර්ධනයට පාංශු ඵලදායිතාව හා ඉඩම් පරිශීලනයට අදාළව ශ්‍රී ලංකාවේ පස්වල රසායනික, භෞතික හා ජීව විද්‍යාත්මක ප්‍රධාන ගුණාංග පිළිබඳ මූලධර්ම, ප්‍රායෝගික පාංශු කළමනාකරණය හා පොහොර භාවිතය.

වාරිමාර්ග මූලධර්මඃ ජල ප්‍රභවයන්, වාරි ජලය හා භාවිතය, මතුපිට හා විසිරුම් වාරි ජල ක්‍රම, ජල ප්‍රභවයන් සැලැස්ම හා කළමනාකරණය.

පාංශු කළමනාකරණය හා සංරක්ෂණය ඃ පාංශු ඵලදායිතාව වැඩි කිරීම සහ නඩත්තුව කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් පාංශු කළමනාකරණ මූලධර්ම භාවිතය, පාංශු ඛාදනය, ජල වහනය, ජල ගැල්මෙන් ආරක්ෂා කිරීම සහ වාරිමාර්ග ආශ්‍රිත ගැටලු, පලතුරු නිෂ්පාදනය, අන්නාසි, අඹ, වැල් දොඩම්, සිට්‍රස්, කෙසෙල් සහ අනෙක් සර්ම කලාපීය පලතුරුවලට වැඩි අවධානය යොමු කරමින් පලතුරු වගා කිරීම.

එළවළු නිෂ්පාදනයඃ දේශීය විදේශීය එළවළු නිෂ්පාදනය හා අළෙවිය, ගොවිපල් මට්ටමින් සත්ත්ව නිෂ්පාදන සමග බෝග නිෂ්පාදනය ඒකාබද්ධ කිරීම.

**දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ දෙවන කොටසට අදාළ ප්‍රශ්න පත්‍රවල විෂය නිර්දේශයන්**

**1වැනි ප්‍රශ්න පත්‍රය - කෘෂිකාර්මික ව්‍යාප්තිය හා අධ්‍යාපනය**

(අ) වැනි කොටස - කෘෂිකාර්මික ව්‍යාප්තිය

කෘෂිකර්ම ව්‍යාප්තිය පිළිබඳ මූලධර්ම, ග්‍රාමීය සංවර්ධනයට ප්‍රවේශයක් වශයෙන් ව්‍යාප්තිය, විවිධ ක්‍රමවල සහ පද්ධතිවල වාසි හා අවාසි, ආදර්ශන, ක්ෂේත්‍ර චාරිකා දේශන, සහභාගීත්ව ඉගෙනුම් වැඩසටහන්, ගැටලු විසඳීම, ප්‍රදර්ශනය හා විවිධ ව්‍යාප්ති ශිල්පීය ක්‍රම අධ්‍යයනය කිරීම.

ව්‍යාප්තියේ විවිධ වැඩසටහන්ඃ අතීත හා වර්තමාන ව්‍යාප්ති වැඩසටහන් සකස් කිරීම, වැඩසටහන් මෙහෙයවීම හා ඇගයීම, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, කෘෂිකර්මයේ සන්නිවේදනය, සන්නිවේදනය යනු කුමක් ද, ව්‍යාප්තියට අදාළ සන්නිවේදන මූලධර්ම හා ඉගැන්වීමේ ද්‍රව්‍ය හා ආධාරක භාවිතය, ව්‍යාප්තියේ සමූහ සන්නිවේදනයට අයත් කාර්යභාරය, එහි විභවය, දැනට පවතින බාධක සහ සීමාවන්, ගැමි සමාජ විද්‍යාව, සංස්කෘතිය, සමාජය, සමාජ විපර්යාස පිළිබඳ විග්‍රහය, ග්‍රාමීය මට්ටමේ සමාජ ආයතන, ප්‍රජා සහ කණ්ඩායම් නායකයන්, කණ්ඩායම් ගති විද්‍යාව, නායකත්ව ශෛලීය සහ කළමනාකරුවන්, ව්‍යාප්තිය ක්‍රියාත්මක කිරීම, කෘෂිකාර්මික සංවර්ධනයේ මූලධර්ම, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ව්‍යාප්ති සංවිධාන වර්ධනය කිරීමේ ගැටලු, අනුවර්තනය වීමේ දී ගොවීන් මුහුණ දෙන ගැටලු විසඳීම.

කෘෂිකාර්මික ව්‍යාප්තියට ආධාර සපයන ආයතන හා සංවිධාන, තරුණ ගොවි සමාජ ව්‍යාපාර, විවිධ සේවා සමූපකාර සමිති හා කෘෂි සේවා කමිටු වැනි ග්‍රාමීය මට්ටමේ සංවිධාන, කෘෂිකර්ම සංවිධානයෙහි ලා සම්බන්ධ අනෙක් දෙපාර්තමේන්තුවල කාර්යයභාරය, දිස්ත්‍රික් සංවර්ධන සභා සහ ස්වේච්ඡා සංවිධාන ආදිය.

(ආ) වැනි කොටස- කෘෂිකාර්මික අධ්‍යාපනය හා පුහුණුව

මූලික මනෝවිද්‍යාව, මූලික සමාජ විද්‍යාව, කෘෂිකර්ම වෘත්තීය අධ්‍යාපන ඉගැන්වීමේ අන්තර්ගතය තේරීම හා සංවිධානය කිරීම සහ ඉගැන්වීමේ ක්‍රම, ගොවි පුහුණුව විශේෂත්වයෙහි සලකා කෘෂිකර්මයට අදාළ වැඩිහිටි අධ්‍යාපනය, තරුණ හා වැඩිහිටි

ගොවීන් සඳහා වැඩසටහන් සැකැස්ම හා ඉගැන්වීමේ සාර්ථක ක්‍රම, සේවාස්ථ පුහුණුව, අවශ්‍ය පුහුණු කිරීම් තක්සේරු කිරීම, පුහුණු වැඩ සටහන් සකස් කිරීම, පුහුණු ශිල්පීය ක්‍රම හා ප්‍රතිඵල තක්සේරුව

### 2වැනි ප්‍රශ්න පත්‍රය - පාංශු හා ජල කළමනාකරණය

පසෙහි භෞතික ගුණාංග, පාංශු ව්‍යුහය කෙරෙහි පරිසරාත්මක හා රෝපණ කටයුතුවල බලපෑම, සාමුහික ස්ථායිතාවය හා එහි ඇගයීම, පාංශු ඛාදනයට හේතුවන කරුණු, පාංශු ගුණාංග කෙරෙහි ඇතිවන පාංශු ඛාදනයේ බලපෑම්, ඛාදන ශක්තිය හා ඛාදන හැකියාව, වාරිමාර්ග පහසුකම් ඇති ඉඩම්වල, විවෘත දිය පහරවල, ඇළවල්වල සහ දියබෙත්මවල තිබෙන පාංශු ඛාදන ගැටලු, පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම, ජල කළමනාකරණය, පාංශු ජල ගලායෑම පිළිබඳ මූලික යාන්ත්‍රණ, පාංශු හා ක්ෂේත්‍ර භාවිතයේ දී අසංතෘප්ත ජලය ගලා යෑමට සම්බන්ධ බලයන්, ජලය යෙදීමේ සැලසුම් කිරීම, සැලසුම් කිරීමේ නිර්ණායකයන් යොදා ගෙන ඒවා ඉදි කිරීම හා ක්‍රියා කරවීම, වාරි ජල සම්පාදනය සඳහා ඉඩම් පිළියෙල කිරීම, වාරි ජලය සඳහා වන ජල මූලාශ්‍ර, වාරිමාර්ග සංවර්ධනය, මතුපිට ජල මාර්ග සංවර්ධනය හා සංරක්ෂණය, භූගත ජලය හා ජල සම්පත් සංවර්ධනය, බෝගවල ජල පරිභෝජනය භාවිතය, නිශ්චය කිරීම හා ඇස්තමේන්තු කිරීම, ලයිසො මීටරය හා වෙනත් මිනුම් ශිල්පීය ක්‍රම, ජලවහන නිර්ණායකයන්, ජලවහන මූලධර්ම හා ක්‍රම, ජලවහන ක්‍රම, වාරිමාර්ග පහසුකම් ඇති ඉඩම්වල හා ගොවිපල තුළ ජලවහන කාණු සහ ජලවහන අවශ්‍යතා සැලසුම් කිරීම.

### 3වැනි ප්‍රශ්න පත්‍රය - පැළෑටි සංරක්ෂණය

(3වැනි ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අයදුම්කරුවෙකුට 7වැනි හා 8වැනි ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ.)

වී, එළවළු, හා පලතුරුවලට වැළඳෙන ආර්ථික වැදගත්කමක් ඇති පළිබෝධ සහ ශ්‍රී ලංකාවේ වැවිලි බෝගවලට වැළඳෙන ප්‍රධාන පළිබෝධකයන් හඳුනා ගැනීම සහ ඔවුන් අයත් පවුල් දක්වා වර්ගීකරණය කිරීම, පළිබෝධ සංගත තත්ත්වයට පත්වීමට හේතු හා ඔවුන්ගේ විශේෂ හැසිරීම් රටාව, කෘමි ගහණය සාම්පල් කිරීමේ ක්‍රම, ඇස්තමේන්තු කිරීමේ ක්‍රම, කෘමි වස හා කෘමීන් මගින් පැතිරෙන පැළෑටි රෝග පිළිබඳ පැළෑටිවලට වන හානිය හඳුනා ගැනීම, කෘමි පාලන මූලධර්ම, විශේෂිත පළිබෝධ මර්දනය සඳහා නිර්දේශිත විවිධ ක්‍රම සහ ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රියා මාර්ගය, කෘමිනාශක, ඒවායේ භාවිතය හා සීමාවන්, ඉසීමේ ද්‍රාවණ පිළියෙල කිරීම, සහ ඒවා පරිහරණය කිරීමේ දී හා බෝගවලට ඉසීමේ දී අනුගමනය කළ යුතු ආරක්ෂක විධි, ඉසිනයක් හා කුඩු ඉසිනයක් මනා ලෙස නඩත්තු කිරීමට සැලකිලිමත්වීම, වසංගත තත්ත්වයන් විශ්ලේෂණය හා පූරෝකථනය, පැළෑටි රෝග, හානි පිළිබඳ සමීක්ෂණය, තක්සේරු කිරීම හා ඇස්තමේන්තු ගත කිරීම.

| | |
|---|---|
| ප්‍රධාන රෝග වර්ග | දියමලන් කෑම, බීජ පැළ අංගමාරය, මුල් කුණුවීම, කොළ මැලවීම, පුස්, මළකඩ, අංගමාරය, ඇන්ත්‍රැක්නෝස්, කොළපුල්ලි, කොළ හැකිලීම, මුල් බරවා, ගැටිති සෑදීම, පිළිකා, කබොලුරෝගය, පත්‍ර විචිත්‍ර කබොලු හා කහවීම, රෝග විද්‍යාව හා ශ්‍රී ලංකාවේ ආර්ථිකමය වටිනාකමකින් යුත් බෝගවලට වැලඳෙන රෝග පාලනය. |
| වසංගත රෝග විද්‍යාව | රෝග කාරකය, ධාරකය හා පරිසරාශ්‍රිත කරුණු, සහ වසංගතය පිළිබඳ අනාවැකි, රෝග මර්ධනය, නිශේදනය, මුලිනුපුටා දැමීම, නීති හා නිරෝධනය, ආරක්ෂක පියවර ගැනීමෙන් රෝග මර්දනය, පළිබෝධ නාශක, ඒවා යෙදීමේ හා ක්‍රියා කිරීමේ විධි, ධාරකවලට ඔරොත්තු දීම මගින් රෝග මර්දනය, රෝගවලට ඔරොත්තු දිය හැකි පරිදි අභිජනනය. |
| වල් පැළෑටි විද්‍යාව | පහත් බිම් හා උස් බිම් තත්ත්වයන් යටතේ වල් පැළෑටි බෝ වීම හා ප්‍රජනනය, වල් පැළෑටි පාලන මූලධර්ම, යාන්ත්‍රික ජීව විද්‍යාත්මක හා රසායනික ක්‍රම, පැළෑටි නාශකවල ගුණාංග හා ක්‍රියාකාරීත්වය, තෝරාබේරා ගසන, වල් නාශක හා ඒවා යොදන අන්දම, වල් පැළෑටි හා බෝග බීජ සහතික කිරීම. |
| දිලීර නාශක | රසායනික විද්‍යාව, සාමාන්‍යයෙන් යොදා ගන්නා ගෙන්දගම්, තඹ, රසදිය, කාබනේට් යන දිලීර නාශක පිළියෙල කර ගැනීම හා ඒවා යෙදීම, පාංශු ධූම කාරක, දිලීර නාශක හා ක්‍රියාකාරී ක්‍රම, දිලීර නාශක හා කෘමි නාශකවල සංගතතාව. |

### 4වැනි ප්‍රශ්න පත්‍රය - බීජ තාක්ෂණ ක්‍රම

(අ) වැනි කොටස- බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයඃ

බීජ නිෂ්පාදනයඃ බීජ නිෂ්පාදනයේ මූලධර්ම, ගුණාත්මක බීජ නිෂ්පාදනයේ වැදගත්කම, නිෂ්පාදන ප්‍රදේශ බීජ නිෂ්පාදනයට අවශ්‍ය වන දේශගුණික තත්ත්වයන්, ප්‍රජනන ක්‍රම, ප්‍රේරනය හා පුෂ්පිකරණ ප්‍රාරම්භණය. ස්වපරාගන හා පරපරාගන බෝගවල බීජ නිෂ්පාදන මූලධර්ම හා ක්‍රම, දෙමුහුම් බීජ නිෂ්පාදනය හා පරාගන ගැටලු, බීජ තවාන් පිළියෙල කිරීම, වැපිරීම සහ පොහොර යෙදීම, වල්පැළෑටි නාශක යෙදීම, පළිබෝධ නාශක යෙදීම, වල්පැළෑටි මර්ධනය, පළිබෝධ හා රෝග පාලනය, අස්වනු නෙළීම හා බීජ වෙන් කර ගැනීම ඇතුළු බෝග පාලනයට අදාළ රෝපණ කටයුතු, රෝපණ බීජ නිෂ්පාදනයේ

ආර්ථිකමය කරුණු , බීජ සකස් කිරීම හා ගබඩා කිරීම, සෑම අවස්ථාවක දී ම බීජවලට හානි පැමිණ වීම අවම කිරීම හෝ වැළැක්වීම කෙරෙහි දැඩි අවධානය යොමු කරමින් බීජ පවිත්‍ර කිරීම, ප්‍රතිකාර කිරීම, වියළීම, අවශ්‍ය තත්ත්වයන්ට පත් කිරීම, ශ්‍රේණි කිරීම, ඇසිරීම, බෙදා හැරීම හා ගබඩා කිරීම.

බීජ ජීව්‍යතාව හා සාම්පල් කිරීම : බීජ තොග කිරීම හා සාම්පල් කිරීම, විෂමජානීතාව හේතු සහ ඒවා සොයා ගැනීම, සංඛ්‍යා ලේඛනාත්මක ඉඩ හැරීම හා ප්‍රයෝජනය.

(ආ) වැනි කොටසඃ බීජ විද්‍යාව හා තාක්ෂණයඃ

බීජ කායික විද්‍යාව, බීජ ව්‍යුහය, බීජ රූප විද්‍යාව, පරාගනය, බීජ නිර්මාණය හා වර්ධනය, මේරීම, ඉදීම, අස්වනු නෙළීමට සුදුසු අවස්ථාව, ජීව්‍යතාව, ප්‍රරෝපණය, බීජවල දිරිමත් බව, බීජ අක්‍රීයතාව, බීජ ව්‍යාධිවේදය, බීජ වලට හානිකර කෘමීන් ගණ, ක්ෂේත්‍රයේ දී හා ගබඩාවේ දී බීජවලට රෝග බෝකරන මීයන් ඇතුළු දිලීර හා වෙනත් ජීවීන්

පැළෑටි නිරෝධනයේ මූලධර්මඃ බීජවල රෝග පාලනය, බීජ පරීක්ෂණයට ලක් කිරීම, බීජ තොගවල විශ්ලේෂණාත්මක පාරිශුද්ධතාව පිළිබඳව රසායනාගාරය තුළ කෙරෙන විශ්ලේෂණයේ නීති සහ ශිල්පීය ක්‍රම අපද්‍රව්‍යයන්, වල්පැළෑටි බීජ, පිරිසිදු බීජ නිෂ්ක්‍රීය ද්‍රව්‍ය හඳුනා ගැනීම, තෙතමන තත්ත්වය, වර්ගීය පාරිශුද්ධතාව, විවිධ බීජවල ලක්ෂණ, විද්‍යාගාරවල දී බීජවල ජීව්‍යතාව, ප්‍රරෝපණය ප්‍රතිශත, අස්වාභාවික වැඩීම ආදිය, දිරිමත්භාවය නිර්ණය කිරීම.

බීජ සහතික කිරීමඃ වර්ගීය පාරිශුද්ධත්වයේ වැදගත්කම, එය ක්ෂේත්‍රයේ දී නිර්ණය කිරීම, ක්ෂේත්‍ර පරීක්ෂණ, පිළිවෙල සහ ප්‍රමිතීන්, විවිධ සහතික කිරීමේ ක්‍රමවල දී විවිධ බීජ සහතික කිරීමේ පංති වල දී සිදුවන විවිධ බීජ පරම්පරාවල් ගුණනය කිරීමේ දී කවලම් වීම් වළක්වා ගැනීම, බීජ තත්ත්ව පාලනය පිළිබඳ මූලධර්ම හා ප්‍රතිපත්ති, බීජ මිල නියම කිරීම, අළෙවි මාර්ග, පිරිවැය පරතරය ආදිය.

### 5වැනි ප්‍රශ්න පත්‍රය - ශෂ්‍ය විද්‍යාව

ශ්‍රී ලංකාවේ පාංශු කාණ්ඩවල අවශ්‍යතාවන්ට සරිලන පරිදි බෝග නිෂ්පාදනය සඳහා පාංශු පාලන ක්‍රම අනුගමනය කිරීම සඳහා වූ භෞතික රසායනික හා ජීව විද්‍යාත්මක පදනම, පසේ සාරවත්කම ජලය පාංශු වයනය හා බෝග නිෂ්පාදනය සඳහා ඉඩම් පිළියෙල කිරීම සම්බන්ධ මූලධර්ම හා භාවිතය සඳහා විවිධ ක්‍රියා මාර්ග කෙරෙහි අවධාරණය කෙරේ. ක්ෂේත්‍ර බෝග වර්ධනය සම්බන්ධ මූලධර්ම පිළිබඳ උසස් දැනීමක් මෙන්ම ඒවායේ වර්ධනය හා මේරීම, වර්ගය හඳුනා ගැනීම, ශ්‍රී ලංකාවේ කෘෂි කාලගුණික හා කෘෂි පාරිසරික කලාපවලට ඒවා හුරු කරගැනීම සහ බෝග වගා ක්‍රම පිළිබඳ දැනුම, වල් පැළෑටි පාලනය, මූලධර්ම, පැළෑටි පාලනය කෙරෙහි වල්පැළෑටි නාශක පරිසර විද්‍යාව ගැන අවධාරණය කරමින් වල්පැළෑටි පාලනය කෙරෙහි වල් පැළෑටි නාශකවල රසායනික විද්‍යාත්මක බලපෑම සහ සියලුම ප්‍රධාන වාර්ෂික බෝගවල වල්පැළෑටි මර්ධනය

### 6වැනි ප්‍රශ්න පත්‍රය - කෘෂිකාර්මික රසායන විද්‍යාව

පාංශු ඛනිජමය හා කාබනික සංඝටකවල ස්වභාවය හා ගුණාංග, අයන හුවමාරු සංසිද්ධිය, කැටායන හුවමාරු ප්‍රතික්‍රියා සහ හුවමාරු කළ හැකි භෂ්ම, රිඩොක්ෂ් ප්‍රභවය සහ ජලයෙන් යට වූ පාංශු රසායනය, පාංශු ආම්ලික බව හා ක්ෂාරීය බව, ලවණතාව හා ලවණ මිශ්‍ර පස්, පාංශුවල ඓන්ද්‍රමය නොවන (ඛනිජමය) පැළෑටි පෝෂණ, පාංශු සමීක්ෂණ, පාංශු වර්ගීකරණ ක්‍රම, ශ්‍රී ලංකාවේ පාංශු හා ඒවායේ වර්ගීකරණය, පාංශුවල සිටින ක්ෂුද්‍ර හා මහා පාංශු ජීවීන් හා පාංශු ගුණාංග කෙරෙහි ඔවුන්ගේ බලපෑම්, පාංශු කාබනික ද්‍රව්‍ය හා ඒවායේ ගුණාංග, පාංශු හා ශාක විශ්ලේෂණ ක්‍රම, පාංශු සාරවත් බවේ භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක කරුණු හා කාබනික පොහොර ඒවායේ ආදේශකයන්, පොහොර නිර්දේශ කිරීම හා ඒවා යෙදීමේ පදනම, පාංශු හා පැළෑටි පෝෂණයෙහි ලා විකිරණශීලී අංශුමාත්‍ර ශිල්ප භාවිතය, ඌනතා සහ විෂ සහිත බිමේ ලක්ෂණ, ප්‍රධාන හා අංශුමාත්‍ර මූලද්‍රව්‍යවල ඌනතා නිවැරදි කිරීම, කෘමිනාශක, දිලීර නාශක හා වල් පැළෑටි නාශකවල රසායනික බව හා ක්‍රියාන්විත ක්‍රම, විවිධාකාරයේ සකස් කිරීමේ දී පාංශු කෘෂි රසායනික සම්බන්ධතාව, පාංශු අංශු මාත්‍ර ශාක සංගති හා සත්ත්ව සංගති කෙරෙහි කෘෂි රසායන ද්‍රව්‍යවල බලපෑම, කෘෂි රසායන ද්‍රව්‍යවල බිඳවැටීම් සිදුවීම, කෘෂි රසායන ද්‍රව්‍යවල රසායනික විශ්ලේෂණය.

### 7වැනි ප්‍රශ්න පත්‍රය - කීට විද්‍යාව

(7වැනි ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අයදුම්කරුවන්ට 3වැනි හා 8වැනි ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ)

කෘමි පවුල දක්වා වර්ගීකරණය කිරීමේ මූලධර්ම හා ක්‍රම විස්තර කිරීමට හා යතුරු (key) සෑදීමට යොදා ගන්නා මේරූ හා නොමේරූ කෘමින්ගේ හිස කොටස, ස්පර්ශකය, මුඛ කොටස් හා උදර කොටස්වල ව්‍යුහය, ලක්ෂණ හා විස්තර, කෘමි ශරීර ආවරණ හා බහිස්‍රාවය, ස්වසන හා ස්නායු පද්ධතියේ ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය, ශ්‍රී ලංකාවේ වගා කළ බෝගවලට වැළඳෙන ආර්ථිකමය වැදගත්කමකින් යුත් පළිබෝධයන්හි ජීව විද්‍යාව, පරිසර විද්‍යාව හා පද්ධතීන් හා ශ්‍රී ලංකාව තුළ ඔවුන්ගේ පැතිරීම, ආර්ථික වැදගත්කමක් ඇති පැළෑටි පරපෝෂිත වටපණුවන්, මයිටාවන් හා මීයන්ගේ ජීව විද්‍යාව හා පරිසර විද්‍යාව, පළිබෝධ පාලනයේ මූලධර්ම හා ක්‍රම සහ කාලීන

ප්‍රවණතා, විවිධ කාණ්ඩවල කෘමි නාශකවල විශේෂ ලක්ෂණ, ඒවායේ භාවිතය හා සීමාවන්, ක්ෂේත්‍ර හා රසායනාගාර අත්හදා බැලීම් කිරීමේ දී යොදා ගනු ලබන විශේෂිත අත්හදා බැලීමේ ක්‍රම, පළිබෝධ මර්ධන ක්‍රම සහ විකල්ප ජෛව පාලනය, ඒකාබද්ධ පළිබෝධ මර්දනය, පෙරමෝන ආදියේ භාවිතය.

### 8වැනි ප්‍රශ්න පත්‍රය - පැළෑටි ව්‍යාධි විද්‍යාව

(8වැනි ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අයදුම්කරුවන්ට 3වැනි හා 7වැනි ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ.)

පැළෑටිවල රෝග නිර්වචනය කිරීම, රෝගවලට හේතු, පරපෝෂිතමය හා පරපෝෂිතමය නො වන රෝග, ව්‍යාධිකාරකයන්හි ප්‍රධාන කාණ්ඩවල ලක්ෂණ හා වර්ගීකරණය, ව්‍යාධිකාරකයන් නිරීක්ෂණය කිරීම, වෙන්කර තිබීම, හඳුනා ගැනීම සහ විමර්ශනය කිරීම, පැළෑටි ව්‍යාධි විද්‍යාවේ ක්‍රම හා ශිල්ප න්‍යායන් පිළිබඳ දැනුම.

රෝග ලක්ෂණ විද්‍යාව- ප්‍රධාන රෝග වර්ග - දියමලන් කෑම, බීජ පැළ අංගමාරය, මුල් හා පාද කුණු වීම, මැළවීමේ රෝගය, පිටි- පුස්, මළකඩ රෝගය, ගඩු, අංගමාරය, ඇන්ත්‍රැක්නෝස්, කොළපුල්ලි, කොළ හැකිලීමේ රෝගය, මුල්බරවා රෝගය, පිලිකා, කබොලු හා පත්‍ර විචිත්‍ර රෝග හා කහවීමේ රෝගය, අස්වනු නෙළීමෙන් පසු හා වෙළඳපොළේ දී ඇති වන රෝග, බීජ මඟින් ඇතිවන රෝග, ශ්‍රී ලංකාවේ ආර්ථික වටිනාකමින් යුතු බෝග වල රෝග නිධාන විද්‍යාව හා මර්දනය.

ධාරකය තුළට ඇතුළු වීම හා ව්‍යාධිකාරක ස්ථාපිත කිරීම, ආසාදනයට බලපාන කරුණු, රෝග ආශ්‍රිත එන්සයිම හා විෂ වර්ග, රෝගී පැළෑටිවල සිදුවන පරිවෘත්තීය වෙනස්කම්, රෝග වලට ප්‍රතිරෝධීතාව රෝගවලින් බේරීම.

වසංගත රෝග විද්‍යාව- ව්‍යාධිකාරක, ධාරක හා පරිසර ආශ්‍රිත කරුණු, වසංගත රෝග පුරෝකතනය, පැළෑටි රෝග සමීක්ෂණ, බෝග හානිය තක්සේරු කිරීම හා ඇස්තමේන්තු කිරීම, බැහැර කිරීම හා මුලිනුපුටා දැමීම මඟින් රෝග පාලනය කිරීම, නීති පැනවීම හා නිරෝධායනය, ආරක්ෂාව සැපයීම මඟින් රෝග පාලනය, පළිබෝධනාශක, ඒවා යෙදීම හා ක්‍රියා කරන අන්දම, ධාරකවල ප්‍රතිරෝධීතාව මඟින් රෝග පාලනය, රෝගවලට ඔරොත්තු දෙන සේ අභිජනනය කිරීම.

### 9වැනි ප්‍රශ්න පත්‍රය- උද්‍යාන විද්‍යාව

උද්‍යාන බෝග ස්ථාපනය කිරීම හා පාලනය (පලතුරු, මල් හා එළවළු) උද්‍යාන බෝග ප්‍රචාරණය, ලිංගික හා අලිංගික ක්‍රම, අලිංගික ප්‍රචාරණ ක්‍රම හා ශිල්ප න්‍යායන්, ග්‍රාහක අනුජ සම්බන්ධතාව, උද්‍යාන විද්‍යා බෝගවල මල් හා ඵල හටගැන්වීම, වාණිජමය පලතුරු වගාව හා එහි සාර්ථකත්වය වැඩි කරවන සාධක, ශ්‍රී ලංකාවේ පලතුරු වාර හා කලාපීය පැතිරීම, පහත දැක්වෙන බෝග පිළිබඳ විශේෂයෙන් අවධානය යොමු කළ යුතු ය. පැඟිරි බෝග, සැපදිල්ලා, අලිපේර, අඹ, පැපොල්, අන්නාසි, කෙසෙල්, පේර, වැල්දොඩම්, කොස්, මිදි, උද්‍යාන විද්‍යා බෝග ඵල නෙළීම, පරිහරණය, සකස් කිරීම හා ගබඩා කිරීම, වාරි ජලය හා වැසි දියෙන් දේශීය හා විදේශීය එළවළු වර්ග වාණිජ මට්ටමින් හා ගෙවතුවල වගා කිරීම.

### 10වැනි ප්‍රශ්න පත්‍රය - කෘෂිකර්ම නිෂ්පාදන ආර්ථික විද්‍යාව හා ගොවිපල් පාලනය

කෘෂිකර්ම නිෂ්පාදනයේ දී ගොවිපල් පාලනයේ ඇති වැදගත්කම, මූලික සංකල්ප, නිෂ්පාදන ශ්‍රිතය, නිෂ්පාදන ශ්‍රිතයන්හි ස්වරූප, නිෂ්පාදන ශ්‍රිතයේ හැඩය, නිෂ්පාදන උපේක්ෂා චක්‍ර ත්වරණය, සම ආදායම් රේඛාවන්, සම්පත් සංයෝජනය හා පිරිවැය අවම කිරීම පිළිබඳ මූලධර්ම, හීන වන ඵලදා න්‍යායේ මූලධර්ම, ආදේශය හා ආදායම් ප්‍රතිවිපාක, කෘෂිකර්මයේ ඇති අවදානම හා අඩමානය, අඩමානයට මුහුණ දීම සඳහා නිෂ්පාදනය නැවත වෙනස් කිරීම, නම්‍යතාවය හා විවිධාංගීකරණය, කෘෂිකාර්මික නිෂ්පාදනවල මිල නියම කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් සහිතව මිල න්‍යාය.

බෝග සත්ව සංයෝජනය ඇගයීම, ගොවිපලේ ප්‍රමාණය හා පරිමාණානුකූල ඵල, පවුල් ගොවිපල්වල වැදගත්කම හා අභිප්‍රාය, සාපේක්ෂ වාසිය පිළිබඳ මූලධර්ම, ගොවිපල් සංවිධානයේ ශක්තිමත්භාවය හා දුර්වලතාව ගැන කරුණු නිර්ණය කිරීමේ දී වාර්තාවල ඇති වැදගත්කම හා උපරිම කරන ආකෘතීන් සඳහා එම තොරතුරු ඇතුළත් කිරීම.

### IIවැනි ප්‍රශ්න පත්‍රය - කෘෂිකර්ම අලෙවිය

Iවැනි කොටස- අළෙවි කිරීම.

අළෙවි කිරීමේ සාමාන්‍ය මූලධර්ම, නිෂ්පාදනයේ හා අළෙවියේ සාපේක්ෂ වැදගත්කම, ශ්‍රී ලංකාවේ අළෙවිය පිළිබඳව කටයුතු කරන ආයතන, අළෙවි වර්ධනය කෙරෙහි බලපෑමක් ඇති කිරීමෙහි ලා එවැනි ආයතනවල කාර්යභාරය, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන අළෙවි කිරීමේ දී මුහුණපෑමට සිදුවන ගැටලු හා අළෙවි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට අදාළ වන මූලධර්ම.

IIවැනි කොටස - ඉඩම් ආර්ථික විද්‍යාව

ආර්ථික විද්‍යාත්මක සංකල්ප ඉඩම් පරිශීලනයට බලපාන අන්දම, ශ්‍රී ලංකාවේ ඉඩම් සඳහා ඉල්ලුම හා සැපයුම, ශ්‍රී ලංකාවේ ඉඩම් පරිශීලනය සැලසුම් කරන අයුරු, ශ්‍රී ලංකාවේ ගොවි ජනපද පිහිටුවීමේ හා මිනිසුන් පදිංචි කරවීමේ වැඩසටහන්වල වැදගත්කම.

**12වැනි ප්‍රශ්න පත්‍රය - පැළෑටි අභිජනනය හා ප්‍රවේණි විද්‍යාව**

පරිණාමයේ හා අභිජනනයේ වර්ණදේහවල කාර්යභාරය, ප්‍රධාන පැළෑටි බෝගවල වැදගත් රූප විද්‍යාත්මක, භෞතවේදක හා ජෛව රසායන ගුණාංග පාලනය කෙරෙන ප්‍රවේණි විද්‍යාත්මක උපක්‍රම, ප්‍රමාණාත්මක ප්‍රවේණිය හා ආවේණිකත්වය ප්‍රවේණිවිද්‍යාව හා ව්‍යාධිවේදීයභාවය, ධාරක ව්‍යාධිකාරක සම්බන්ධතාවයන් හා ධාරක කෘමි පළිබෝධ සම්බන්ධතාව, අභිජනන ක්‍රමවලට සම්බන්ධ වූ පැළෑටි වැඩිදියුණු කිරීමේ ක්‍රම, විශේෂ පැළෑටි අභිජනන ශිල්ප ක්‍රම, අස්වනු පරාමිති සඳහා අභිජනනය, වගා ක්‍රම භෞතවේදීය ආතතියට ප්‍රතිරෝධීතාව හා රෝග කෘමි පළිබෝධවලට ප්‍රතිරෝධීත්වය, බෝග පැළෑටි අභිජනනයේ නව ක්‍රම.

විවිධ පාලන මට්ටම් යටතේ සහ වෙනස් වන ඍතු හා කෘමි පරිසර විද්‍යාත්මක තත්ත්වයන් යටතේ ප්‍රවේණි දර්ශ අනුවර්තනය වීම. අස්වැන්න හා අස්වැන්නේ සංරචකයන් කෙරෙහි ප්‍රවේණි විද්‍යාත්මක හා පරිසර ශ්‍රිත බලපෑම, පැළෑටි ප්‍රවේණි විද්‍යාත්මක සම්පත් සංරක්ෂණය හා පරිශීලනය.

**13වැනි ප්‍රශ්න පත්‍රය - පැළෑටි භෞතවේදය**

අ) බෝග පැළෑටිවල සිදුවන සංස්ලේෂණය හා වර්ධනය
ප්‍රභාසංස්ලේෂණ ක්‍රම හා ප්‍රභාසංස්ලේෂණයේ භෞතවේදය, සනාල පරිසර්පණය, එහි ගමන් මග, යාන්ත්‍රණයන් සහ පැතිරී ඇති පිළිවෙල.

ආ) වර්ධන නියාමක
ඒවායෙහි ඇතිවන, ව්‍යාප්ති හා පරිවෘත්තීය හා පරිවෘත්තීය ක්‍රියාකාරිත්වයේ යාන්ත්‍රණය, ඒවායේ කාර්යභාරය, වර්ධනයට හා සංවර්ධනයට අදාළ නියාමන කාර්යයන්.

ඇ) සංවර්ධනය
ප්‍රරෝහණය කිරීම හා අක්‍රීය කිරීම, ළපටි බව, පැසුණු බව හා වියපත් බව, මල් හට ගැනීම, ඵල හට ගැනීම, ආකන්ද හා බල්බ හට ගැනීම.

ඈ) පැළෑටි වර්ධනය හා සංවර්ධනය සම්බන්ධ පාරිසරික සාධක හා ඒවායෙහි කාර්යභාරය

**14වැනි ප්‍රශ්න පත්‍රය - කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව**

**Iවැනි කොටස - ජලාධාර කළමනාකරණය හා ජල සම්පාදනය**

කෘෂිකර්ම විද්‍යාවේ මතුපිට හා භූගත ජල සම්පත්, පාංශු හා ජල කලමනාකරණ මූලධර්ම, උපද්‍රව හා ඒවා පාලනය කිරීමේ ක්‍රම, ජලාධාර කළමනාකරණය පිළිබඳ ආර්ථික විද්‍යාව

ජල සම්පත් හා පාංශු කළමනාකරණයඃ ජල සම්බන්ධතාව, බෝගවල ජල අවශ්‍යතාව, ජලසම්පාදනය සඳහා බිම් මැනීම හා මට්ටම් කිරීම, ඉඩම් සංවර්ධනය, ජල සම්පාදන ක්‍රම, පෘෂ්ඨීක ජල සම්පාදනය, ශාක වියන් මත ජල සම්පාදනය, බිංදු ජල සම්පාදනය, ජලසම්පාදන ක්‍රම හා ව්‍යුහ, ජල සම්පාදන සැලසුම් කිරීම, කාර්යක්ෂම ජල කළමනාකරණය, සම්පාදන කරන ජලයෙහි තත්ත්වය, සම්පාදනය කරන ජලය මැනීම, ජල සම්පාදන තාක්ෂණය ක්ෂේත්‍රයට ගැළපෙන සේ අනුගත කිරීම, ජලපහර මැනීම, ජලපහර පාලනය කිරීමේ ව්‍යුහයන්, ගුරුත්ව සහ උස්සාන ජල සම්පාදන ක්‍රම, ජල සම්පාදනයේ දී සිදුවන හානි, ජල සම්පාදන අවශ්‍යතා, ජල සම්පාදන කාර්යක්ෂමතාව, ජල සම්පාදන කාල සටහන සැකසීම, ජලය සැපයීම, බෙදා වෙන් කිරීම, ජල සම්පාදන නිර්මිත, පුනරුත්ථාපනය, ජල සම්පාදන කළමනාකරණය සඳහා බෝග විවිධාංගීකරණය, ශ්‍රී ලංකාවේ ජල කළමනාකරණ ප්‍රතිපත්ති.

**IIවැනි කොටස - ගොවිපල් යාන්ත්‍රීකරණය**

ගොවිපල් යාන්ත්‍රීකරණයේ කාර්යභාරයඃ

නිසි කලට වගා කිරීම, අස්වනු නෙළීමේ සීඝ්‍රතාව වර්ධනය කිරීම, නිෂ්පාදන ගුණාත්මක බව, ප්‍රමාණාත්මකව වැඩි දියුණු කිරීම, අස්වනු හානිය අවම කිරීම, අස්වනු නෙළීමට පෙර හා පසුව සිදුවන හානිය අවම කිරීම, ජලය උපරිම ලෙස උපයෝජනය, කෘෂිකර්මය කෙරෙහි තරුණ පරපුර ආකර්ෂණය කර ගැනීම, කම්කරු ගැටලු විසඳීම.

භාවිත කරන යන්ත්‍ර හා උපකරණ කාරක, මූලධර්ම හා නිශ්චිත අවශ්‍යතා, ඉඩම් සැකසීම, (මූලික බිම් සැකසීම, ද්විතීක බිම් සැකසීම හා බීජ පාත්ති සැකසීම), පැළ සිටුවීම (බීජ සිටුවීම හා පැළ සිටුවීම), බෝග කළමනාකරණය (වල් නෙළීම, කෘමි පාලනය, රෝග පාලනය, කෘමි රසායන භාවිතය), ජල සම්පාදනය (හී විටි, පිටාර හා ක්ෂුද්‍ර), අස්වනු නෙළීම (ගොයම් කැපීමේ යන්ත්‍ර, ගොයම් මැඩීමේ යන්ත්‍ර, සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍ර, පලතුරු නෙළීමේ යන්ත්‍ර, ධාන්‍ය සැකසීම (පොතු ඉවත් කිරීම, පිරිසිදු කිරීම සහ විභේදනය කිරීම.)

ගොවිපල ශක්ති ප්‍රභව පැවතීම හා සීමාසහිත වීම (සතුන්, ට්‍රැක්ටර්, යන්ත්‍ර, විදුලිය, ප්‍රතිජනනය කළ හැකි ශක්ති ප්‍රභව)

අභ්‍යන්තර දහන යන්ත්‍ර ( සිව් පහර, ද්වි පහර පෙට්‍රල් හා ඩීසල් ) ස්ථාපනය කිරීම හා ඒවායෙහි කාරක මූලධර්ම, ප්‍රතිජනනය කළ හැකි ශක්ති ( සුළං හා සූර්ය) උද්ධරනය කිරීමේ ක්‍රම, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ හා ට්‍රැක්ටර්වල ශක්ති සම්ප්‍රේෂණ ක්‍රම.

ඉඩම් සැකසීමට භාවිතා කරන යන්ත්‍රෝපකරණ (නගුල් යනාදිය) සවි කිරීමේ ආකාර, සීරු මාරු කිරීම හා නඩත්තු කිරීම, යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීමේ (බීජ සිටුවීමේ යන්ත්‍ර, පැළෑටි සිටුවීමේ යන්ත්‍ර), බෝග කළමනාකරණය (වල් ඉදිරීමේ යන්ත්‍ර, විසරණ යන්ත්‍ර, ජල පොම්ප, ක්ෂුද්‍ර ජලසම්පාදනය, උපකරණ), අස්වනු නෙළීම හා මැඩීම ( ගොයම් කැපීමේ යන්ත්‍ර, බහු බෝග මඩින යන්ත්‍ර, කුඩා හා අධි ධාරිතා), මඩින යන්ත්‍ර (කුඩා හා අධි ධාරිතා මඩින යන්ත්‍ර, සංයුක්ත අස්වනු නෙළන යන්ත්‍ර) ධාන්‍ය සකස් කිරීම.

ගොවිපල් යන්ත්‍රෝපකරණ පිළිබඳ පූර්වාරක්ෂණ උපදෙස්, ගොවිපල යන්ත්‍රෝපකරණවල පිරිවැය හා ප්‍රතිලාභ ඇගයීම, රනිල බීජ හා ධාන්‍ය ගබඩා කිරීමේ ක්‍රම, ගබඩා කිරීමේ දී සිදුවන හානි හා ගබඩා කිරීමේ දී සිදුවන හානි වළක්වා ගැනීමේ ක්‍රම, එළවළු/ පළතුරු/ ධාන්‍ය වියළීමේ ක්‍රම, වියළීමේ යන්ත්‍රෝපකරණ, අව්වේ වේළීම ( සෘජු වියලීමේ උපකරණ )

අගය එකතු කිරීම, තාක්ෂණික ක්‍රම, ධාන්‍ය පොතු ඉවත් කිරීම හා විභේදනය, ඇසිරීම, ටින් කිරීම හා බෝතල් කිරීම, ප්‍රවාහන ආරක්ෂක ක්‍රම, තෙල් නිස්සාරණ ක්‍රම හා විවිධ බීජ සඳහා විශේෂිත යන්ත්‍රෝපකරණ.

## 15වැනි ප්‍රශ්න පත්‍රය - මල් වැවීම හා උද්‍යාන අලංකරණය

### 1වැනි කොටස - සාමාන්‍ය මල් වැවීම

විසිතුරු පැළෑටි ප්‍රචාරණයඃ විසිතුරු ශාක, පඳුරු, කුඩා පැළෑටි වර්ග හා වැල්, තවාන් පාලන හා විසිතුරු පැළෑටි සඳහාවන තාක්ෂණික ක්‍රම, තෘණ පිටි, ශාක වැටි, ශාක පාත්ති, ගිරි උද්‍යාන, ජල උද්‍යාන හා අනෙකුත් විසිතුරු ලක්ෂණ සහිතව සකස් කිරීම, නඩත්තු කිරීම, රැකබලා ගැනීම, නඩත්තුව හා ආරක්ෂා කිරීම ශාක ශල්‍යකර්ම, මූලික ශාක වර්ගීකරණය, ඕකිඩ්, ඇන්තූරියම්, රෝස, කැනාස්, ඩේලියා හා වාර්ෂික මල් පිපෙන ශාක වැනි මල් හට ගන්නා බෝග වගා කිරීම, ඖෂධ පැළෑටි වගා කිරීම, පැළෑටි ආරක්ෂණය හා කෘමි රෝග පාලනය, අඩු වැදගත්කමක් ඇති ආර්ථික පැළෑටි පිළිබඳ දැනුම.

### IIවැනි කොටස - නාගරික උද්‍යාන විද්‍යාව හා උද්‍යාන අලංකරණය

උද්‍යාන සැලසුම් මූලධර්ම, උද්‍යාන සැකසීමේ ක්‍රම, තෘණ පිටි පාත්ති, වැටිවල සැලසුම් හා ගිරි උද්‍යාන, ජපන් උද්‍යාන, ජල උද්‍යාන යනාදියෙහි විශේෂ ලක්ෂණ, පාර දෙපස ශාක සිටුවීමේ උද්‍යාන සැලසුම්, උද්භිද උද්‍යාන, ගෙවතු, කාර්යාල භූමි ආදිය සැලසුම් කිරීම.

## 16වැනි ප්‍රශ්න පත්‍රය - ආහාර විද්‍යාව

ආහාරවල ඇති රසකාරක සංයෝග, පිෂ්ඨය, ලිපිඩ, විටමින්, ඛනිජලවණ සහ අනෙකුත් සූප සංඝටක, ආහාරවල තිබෙන මෙම සංඝටකවල රසායනික වෙනස්කම් හා ඒවා අතර ආකර්ෂණය, ජලය හා ආහාරවල අන්තර්ගත ජලය අතර සම්බන්ධතාව.

එන්සයිම හා එන්සයිම විද්‍යාවඃ ආහාරවල එන්සයිම මඟින් සිදුවන වෙනස්කම්, ආහාරවල සෙලියුලෝස් පරිවෘත්තීය, ඇමයිනෝ අම්ල හා ලිපිඩ ආහාරවල තිබෙන අනෙකුත් පරිවෘත්තීය සංඝටක.

ක්ෂුද්‍ර ජීවීන්:- ක්ෂුද්‍ර ජීවීන් වර්ග, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක ක්‍රමවේද, ක්ෂුද්‍ර ජීවීන් වගාව හා ක්ෂුද්‍ර ජීවීන් වර්ණ ගැන්වීම, ආහාරවල වෙසෙන ක්ෂුද්‍ර ජීවීන්, හානිකර හා හිතකර ක්ෂුද්‍ර ජීවීන්, ආහාරවල වෙසෙන ක්ෂුද්‍ර ජීවීන් පාලනය කිරීම, ආහාර නිෂ්පාදනය, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ප්‍රධාන ආහාර සංඝටකවල ව්‍යුහාත්මක ලක්ෂණ, ධාන්‍යය හා අනෙකුත් පිෂ්ඨය අඩංගු ආහාර, කිරි නිෂ්පාදන හා මේද අඩංගු නිෂ්පාදන, මාළු හා මස් නිෂ්පාදන, පලතුරු හා එළවළු, ආහාර නරක් වීම, ආහාර නරක් වීමේ හේතුකාරක, උෂ්ණත්ව ක්‍රියාවලිය, විජලීයකරණය, අධිශීතකර කල් තබා ගැනීම.

**17වැනි ප්‍රශ්න පත්‍රය - පෝෂණය හා සෞඛ්‍ය විද්‍යාව**

ආහාරවල ක්‍රියාකාරීත්වය හා පොදු සංයුතිය, පිෂ්ඨය, මේදය හා ප්‍රෝටීන්වල මූලික ව්‍යුහය, ශක්ති අවශ්‍යතා හා ප්‍රභව, ඇමයිනෝ අම්ල හා ප්‍රෝටීන් අවශ්‍යතා, ප්‍රෝටීන් ප්‍රභව, විටමින් හා ඛනිජවල ක්‍රියාකාරීත්වය, අවශ්‍යතා හා සමබර ආහාර ප්‍රභව, ශක්ති ජනක ආහාර, පෝෂ්‍යය පදාර්ථ ජීර්ණය අවශෝෂණය හා හුවමාරුව, ශක්ති ජනක ආහාරවල පරිවෘත්තීය, පෝෂණය හා රක්තහීනතාව, නිෂ්පාදන අපද්‍රව්‍ය බැහැරලීම, සමබර ආහාර වේලක් පිළිබඳ සංකල්පය.

ධාන්‍යඃ- සංයුතිය, සැකසීමේ දී හා පිසීමේ දී පෝෂණ හානිය, ධාන්‍ය අඩංගු ආහාර වේලක ඌනතා, අනෙකුත් පිෂ්ඨමය ආහාරවල සංයුතිය හා භාවිතය, රනිල ධාන්‍යවල සංයුතිය හා භාවිතය, රනිල ධාන්‍යවල සංයුතිය, පිසීමේ දී ඇතිවන ඵල හා විවිධ රනිල ආහාරවල සාපේක්ෂ ගුණාත්මකභාවය, තෙල් ඇට හා ගෙඩි, එළවළු හා පලතුරු, කිරි හා කිරි නිෂ්පාදන, මස්, මාළු හා බිත්තරවල සංයුතිය හා පෝෂ්‍යගුණය, ආහාරවල අඩංගු විෂ ද්‍රව්‍ය, ආහාර දත්ත භාවිතය, ශ්‍රී ලංකාවේ ආහාර වේල, කළලයේ සිට භ්‍රෑණය, ළදරුවා, ළමයා හා වැඩිහිටියා දක්වා වර්ධනය සිදුවන කාලයේ දී පෝෂණය, ගර්භණී සහ කිරිදෙන කාලයේ දී පෝෂණය, වයස්ගත වූවෙකුගේ පෝෂණය, සනීපාරක්ෂාව හා රෝග බෝවීම සමග පෝෂණයෙහි අන්තර් සබඳතාව, පෝෂණ ඌනතා රෝග සංසටකයක් සමග බැඳෙන අනෙකුත් ආබාධ, පෝෂණ ආබාධ පිළිබඳ වසංගත රෝග විද්‍යාව හා පවුලක් වශයෙන් හා පුද්ගලික වශයෙන් ආහාර, ආහාර පරිභෝජනය කෙරෙහි සංස්කෘතිය, සම්ප්‍රදාය, ජලය හා ඉන්ධන සඳහා ප්‍රවේශය, කාලයෙහි බලපෑම හා කම්කරු යෙදවීම, රෝග හා පෝෂණත්වය අතර අන්තර් සම්බන්ධතාව.

ගෘහයට ආහාර පාන සැපයීමඃ- ආහාර පුරුදු හා සංකල්පය, ගෘහය ඇතුළත තීරණ ගැනීම, පවුලේ සාමාජික සංඛ්‍යාවේ බලපෑම, උපත් පරතරය, සම්ප්‍රදායික දැනුම හා අධ්‍යාපනය, ප්‍රජාවෙහි හා පුද්ගල පෝෂණ තත්ත්වය ඇගයීම, ගෘහවල ගබඩා කර ඇති ආහාර සහ ගෘහයක සාමාජිකයින් විසින් හා පුද්ගලයකු විසින් පරිභෝජනය කරනු ලබන ආහාර සාම්පල එකතු කිරීමේ දී හා දත්ත අර්ථ කථනය කිරීමේ දී පැන නගින ගැටලු.

ආහාර පද්ධතියක විවිධ අවස්ථාවල නිර්ණයන්, ගෘහ පෝෂණ තත්ත්වය දර්ශක ලෙස යොදා ගැනීම, පවත්නා පෝෂණ දත්ත, නාගරික, ග්‍රාමීය හා වතු අංශයේ ප්‍රාදේශීය, සමාජයීය හා ආර්ථික සංවිධාන කණ්ඩායම් මඟින් පෝෂණ තත්ත්වය ලබා ගැනීම. අවදානම සහ ප්‍රවණතාවට එරෙහිව මන්දපෝෂණය ප්‍රකාශයට පත් කිරීමේ සංකල්පය, ජනගහන වර්ධනය හා බැඳුනු සමාජ හා ආර්ථික සම්බන්ධතා, ජනගහන පාලනය කිරීම.

අතීත හා වර්තමාන ප්‍රධාන පෝෂණ හා සෞඛ්‍ය ප්‍රතිපත්ති සැකෙවින් දැක්වීම, පෝෂණ සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි ඒවායෙන් සැලසෙන ප්‍රතිපාදන, සහල් සලාකය, ආහාර මුද්දර, ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ ජාලය, ජාත්‍යන්තර ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (IRDP) හා ආහාර පද්ධති පිළිබඳ මහවැලි ව්‍යාපෘතිය සහ පෝෂණ තත්ත්වය යනාදියෙහි බලපෑම, දිස්ත්‍රික්/ ප්‍රාදේශීය මට්ටමේ ගෘහ මට්ටමේ අන්තර් සබඳතා, සන්නිවේදන ජාල අදහස් ඉහළ තලයන්ට හුවමාරු කිරීම.

ශ්‍රී ලංකාවේ පෝෂණ හා සෞඛ්‍ය අංශවල මැදිහත්වීම්, අතීතයේ පැවැති ව්‍යාපෘති සමාලෝචන හා අනාගත ව්‍යාපෘතින්.

***පස්වැනි පරිශිෂ්ටය***

*3වන කාර්යක්ෂමතා කඩ ඉම සමත්වීම සඳහා නිලධාරින් විසින් සම්පූර්ණ කළ යුතු සුදුසුකම්*

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පශ්චාත් උපාධි සුදුසුකම් තීරණය කරනු ලබන කමිටුව විසින් පිළිගනු ලබන ලිඛිත පර්යේෂණ නිබන්ධනයක් සම්පූර්ණ කර තිබීම.

පශ්චාත් උපාධි සුදුසුකම් තීරණය කිරීමේ කමිටුවේ සංයුතිය පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| 1. | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් | (සභාපති) |
| 2. | කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝජිතයෙක් | (සාමාජික) |
| 3. | පේරාදෙණිය, විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ | (සාමාජික) |
| 4. | පේරාදෙණිය,විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨාධිපති | (සාමාජික) |
| 5. | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ විධායක අධ්‍යක්ෂ | (සාමාජික) |

*හයවැනි පරිශිෂ්ටය*

ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියට/ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාළ වන අයදුම්පත්‍රය (ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු යි.)

01. ආ) ඉල්ලුම්කරුගේ මුලකුරු සමඟ නම :-
ආ) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :-
02. උපන් දිනය :-
03. වර්තමාන රාජකාරි ලිපිනය :-
04. බඳවා ගැනීමේ තනතුරු නාමය :-
05. අ) ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II/II ශ්‍රේණියට හෝ III ශ්‍රේණියට පත් වූ දිනය :-
ආ) ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියට පත් වූ දිනය :-
ඇ) බඳවා ගන්නා ලද ආකාරයඃ- සීමිත/ විවෘත :-
06. ඔබේ තනතුරට අදාළ වැටුප් තලය :-
07 I) වර්තමාන වැටුප් තලය :-
II) එම වැටුප් තලයට එළඹීමට අදාළ විස්තර :-
08. නියමිත කාර්යක්ෂමතා කඩඉම පිළිබඳ විස්තර :-

| *කාර්යක්ෂමතා කඩ ඉම් හා වැටුප් තලය* | *එළඹි දිනය* | *විභාගය හෝ උපාධිය සම්පූර්ණ කළ දිනය* | *කාර්යක්ෂමතා කඩඉම උසස් කළ දිනය* |
|---|---|---|---|
| | | | |
| | | | |

09. ....................කාර්යක්ෂමතා කඩඉමෙන් උසස් කරනු ලැබීමට සුදුසුකම් ලැබුයේ කෙසේ ද?
I. පශ්චාත් උපාධි සුදුසුකම් ලැබීමෙන්
II. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීමෙන්
(අදාළ නොවන කොටස් කපා හැර ලිපි යොමු දක්වන්න)
10. පසුගිය අවුරුදු 05 කාලය තුළ ඔබ නියමිත දිනයේ දී සියලු වැටුප් වර්ධක උපයා තිබේ ද?
11. උසස් වීමට සුදුසුකම් ලැබීමට පෙරාතුව අවුරුදු 05ක කාලය තුළ කිසියම් වරදක් හේතුකොට ගෙන විනයානුකූල දඬුවමකට භාජනය වී තිබේ ද? වරද ඇතුළත් වන ආයතන සංග්‍රහයේ IIවැනි කාණ්ඩයේ කුමන උපලේඛනයට ද යන්න හා වරද කළ දිනය සඳහන් කරන්න.
12. ඔබ මුල් පත්වීමේ සිට මේ දක්වා ලබාගෙන ඇති වැටුප් රහිත නිවාඩු විස්තර සපයන්න.

| *වැටුප් රහිත නිවාඩු ලබා ගත් කාල පරිච්ඡේදය* | | *මුළු කාලය* | | |
|---|---|---|---|---|
| *දින සිට* | *දින දක්වා* | *අවුරුදු* | *මාස* | *දින* |
| | | | | |
| | | | | |
| | | | | |

13. I. ඉහත 12 ඡේදයේ සඳහන් වැටුප් රහිත නිවාඩු කාලය අඩු කළ විට දස අවුරුදු සක්‍රීය සේවා/ හත් අවුරුදු සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කරන දිනයඃ-
II. ඉහත 10 ඡේදය අනුව සුදුසුකම් සම්පූර්ණ කරන දිනයඃ-
III. ඉහත ඡේදයට යටත්ව සුදුසුකම් සම්පූර්ණ කරන දිනයඃ-
14. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියට/ I ශ්‍රේණියට උසස් කරනු ලැබීම සඳහා තමා ඉල්ලුම් කරන දිනයඃ-
15. ඉහත 14 ඡේදය යටතේ සඳහන් කර ඇති දින සිට මා ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියට/ I ශ්‍රේණියට උසස් කරනු ලැබීමට සියලු සුදුසුකම් ලබා ඇති බවත්, ඉහත 1-14 දක්වා සපයා ඇති විස්තර මගේ පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බවත් සහතික කරමි.

...........................................
අයදුම්කරුගේ අත්සන

දිනය :..........................

10-242

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.